# ශ්‍රී ලංකාවේ ආන්තිකරණයට ලක් වූ තරුණ කණ්ඩායම්වලට COVID-19 වසංගතයෙන් සිදු වූ බලපෑම පිළිබඳ අධ්‍යයනය



අධ්‍යාපන සංවර්ධන සන්ධානය

# අධ්‍යයනය සිදුකළ තරුණ පර්යේෂකයින් කණ්ඩායම



නිමේෂ් මොණරවිල
කොළඹ දිස්ත්‍රික්කය



දිනිති අලහප්පෙරුම
මාතර දිස්ත්‍රික්කය



ජෙගනාදන් දුෂාන්ති
රත්නපුර දිස්ත්‍රික්කය



හර්ෂනී දයානන්ද
අනුරාධපුර දිසත්‍රික්කය



පියුමාල් අතුකෝරල
මාතර දිස්ත්‍රික්කය

ප්‍රථම මුද්‍රණය: 2020 ජූලි

පිටු සැකසුම: සමන්ත ඉන්ද්‍රජිත්

වාර්තාව සැකසීම: ශාන්ත කුලතුංග සහ දිනිති අලහප්පෙරුම

**ප්‍රකාශනය**

අධ්‍යාපන සංවර්ධන සන්ධානය
අංක 51/1, සිල්වා පටුමග, රාජගිරිය
දුරකතන අංකය: 0112887642

# පටුන

1. හැඳින්වීම ........................................................................................................ 1-5
2. පර්යේෂණ අරමුණ .............................................................................................. 6
3. ක්‍රමවේදය ............................................................................................................ 6
4. නියැදිය .............................................................................................................. 7
5. අධ්‍යයනයේ සීමාකාරී සාධක ............................................................................ 8
6. ප්‍රතිඵල විශ්ලේෂණය .......................................................................................... 8-9
7. COVID-19 වසංගත තත්ත්වය හේතුවෙන් ඇති වූ ආර්ථික සාධක.............. 10-13
8. සාමාජීය බලපෑම ............................................................................................. 13-15
9. මානසික බලපෑම සහ ඒවා අවම කිරීමට ඔවුන් විසින් උපයෝගී
කරගන්නා ක්‍රියාමාර්ග ........................................................................................ 15
10. අධ්‍යාපනයට ඇති වී තිබෙන බලපෑම ............................................................ 16-19
11. නිර්දේශ ........................................................................................................... 20-22

# ශ්‍රී ලංකාවේ ආන්තීකරණය වූ තරුණ කණ්ඩායම්වලට COVID-19 වසංගතයෙන් සිදු වූ බලපෑම පිළිබඳ අධ්‍යයනය

## 1. හැඳින්වීම

2019 නොවැම්බර් මාසයේ චීනයේ වූහාන් නගරයෙන් ආරම්භ වූ නව කොරෝනා වෛරසය මේ වන විට ලෝකයේ බොහෝ රටවල මිනිස් ජීවිත බිලි ගනිමින් සෑම රටක ම පාහේ සමාජ, ආර්ථික ගැටලු රැසක් අත්කර දී තිබේ. ලෝක සෞඛ්‍ය සංවිධානයේ නවතම වාර්තාවලට අනුව මේ වන විට ලෝකයේ රටවල් 190කට අධික සංඛ්‍යාවක හයලක්ෂයකට අධික මිනිස් ජීවිත බිලිගනිමින් මිලියන 17කට අධික පිරිසකට වෛරසය ආසාදනය වී ඇත. ශ්‍රී ලංකාව ද කොරෝනා වෛරසයේ ගොදුරක් බවට පත් වූ රටවල් අතර සිටි නමුත් කොරෝනා රැල්ලේ දැඩි අවධානමට ලක්වීමට පෙර එය පාලනය කිරීමට සමත් වූ බැවින් සිදු වූ මිනිස් හානිය ලෝකයේ අනෙකුත් රටවල් සමග සසඳා බලන කළ ඉතා අවම මට්ටමක පවතියි. තත්ත්වය එසේ වුව ද මධ්‍ය ආදායම් ලබන දකුණු ආසියාවේ සංවර්ධනය වෙමින් පවතින රටක් වන ශ්‍රී ලංකාවට නව කොරෝනා වෛරසය ඇති කළ සමාජ හා ආර්ථික කම්පනය ඉතා ඉහළ ය.

ශ්‍රී ලංකාවේ ආදායම් මූලාශ්‍ර පිළිබඳව අවධානය යොමු කිරීමේදී සමස්ත ආදායමෙන් කැපී පෙනෙන ප්‍රතිශතයක් විදේශ රටවල සිටින ශ්‍රමිකයින්ගෙන්, විශේෂයෙන් ම මැදපෙරදිග කලාපයේ සේවය කරන ශ්‍රී ලාංකිකයන් විසින් එවනු ලබන සම්ප්‍රේෂණවලින් සමන්විත වේ. මෙයට අමතරව ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන වශයෙන් ඇඟලුම් අපනයනය හැඳින්විය හැකි ය. එසේම ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය නංවාලීම සම්බන්ධයෙන් සංචාරක කර්මාන්තය පිළිබඳව ද මහත් බලාපොරොත්තු තබා තිබිණි.

ලොව පුරා COVID-19 වසංගත තත්ත්වය ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වීමත් සමගම රටවල් වසා දැමීමත් අන්තර්ජාතික වශයෙන් සිදු වන ගමනාගමනයට සහ ප්‍රවාහනයට සීමාකාරී තත්ත්වයක් පැන නැගීමත් සමගින් ඉහතින් සඳහන් කරන ලද ප්‍රධාන ආර්ථික ක්‍රියාවලීන්ට දැඩි බලපෑමක් මතු විය. මැදපෙරදිග සංක්‍රමණිකයින්ගෙන් ලැබුණු ආදායම මෙම වසරේ මුල් කාර්තුවේදී සැලකිය යුතු මට්ටමින් පහළ ගිය අතර එම රටවල වසංගත තත්ත්වයන් උත්සන්න වීම හේතුකොට ගෙන මෙම ශ්‍රමිකයින් තමන් ලංකාවට ගෙන්වා ගැනීමට කටයුතු කරන මෙන් ඉල්ලාසිටීම මත තත්ත්වය තවදුරටත් බරපතල විය. මෙයට අමතරව වෙනත් විවිධ රටවල්හි රැකියා කරමින් සිටි ශ්‍රී ලාංකිකයින් සැලකිය යුතු පිරිසකට මෙම වසංගත තත්ත්වයන් නිසා එම රටවල් තම ආර්ථිකයට සිදු වන බලපෑම් අවම කිරීමට අනුගමනය කරනු ලැබූ ක්‍රියාමාර්ග හමුවේ රැකියා අහිමිවීම නිසා එම අදායම් මූලාශ්‍රයන් ද අවදානම් තත්ත්වයකට පත් වී තිබේ.

ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයනක් වන ඇගලුම් කර්මාන්තයට දරුණු බලපෑමක් මෙම වසංගත තත්ත්වය නිසා ඇතිවිණි. ශ්‍රී ලංකාවේ ඇගලුම් අපනයන වැඩි වශයෙන් මිල දී ගනු ලැබූ ඇමෙරිකාව සහ යුරෝපා වෙළඳපොළේ මෙම ඇගලුම් සඳහා වූ ඉල්ලුම කැපී පෙනෙන ලෙස පහත වැටිණි. ප්‍රවාහනය සහ ගමනාගමනය සීමා කිරීමත්, රටවල් වසා දැමීමත්, අපනයන සීමාවීමත් සහ ආනයන සීමා කිරීමත් මත අවශ්‍ය අමුද්‍රව්‍ය ලබාගැනීමට නොහැකි වීමත් මෙම කර්මාන්තයට දැඩි සෘණාත්මක බලපෑම් ඇතිකර තිබේ. රජය විසින් සිදුකරන ලද ගමනාගමනය සීමා කිරීම්, ප්‍රදේශ වසා දැමීම සහ අත්‍යවශ්‍යය නොවන කර්මාන්ත හා ව්‍යාපාර තාවකාලිකව වසාදැමීම හේතුකොට ගෙන කර්මාන්තය සඳහා අවශ්‍ය ශ්‍රමිකයින් සපයා ගැනීම දුෂ්කර විය. මෙම තත්ත්වයන් හමුවේ කර්මාන්තය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා විවිධ වූ ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට කර්මාන්ත හිමියන් කටයුතු කරනු ලැබූ අතර මේවාට සේවකයින් ප්‍රමාණය අඩු කිරීම, වැඩමුර ප්‍රමාණය අඩුකිරීම සහ දිරි දීමනා, අතිකාල දීමනා කපාහැර, දෛනික වැටුප් හා මූලික වැටුප පමණක් ගෙවීම යනාදිය ඇතුළත් වේ.

මෙයට අමතරව ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය කෙරෙහි ද වසංගත තත්ත්වය අතිමහත් බලපෑමත් ඇති කළේ ය. පසුගිය වසරේ අප්‍රේල් මාසයේ දී සිදු වූ පාස්කු ප්‍රහාරයත් සමගින් අඩාල වූ සංචාරක ව්‍යාපාරය කිසියම් ආකාරයකින් නැවත යථා තත්ත්වයට පැමිණෙමින් පවතින අවස්ථාවක ඇති වූ මෙම තත්ත්වය මගින් සම්පූර්ණයෙන් ම අකර්මන්‍ය වී තිබේ. ගුවන් තොටුපළවල් වසා දැමීම සහ අන්තර්ජාතික ගමනාගමනයට පැන වූ සීමාවන් මෙන් ම දේශිය වශයෙන් ගමනාගමනය සම්බන්ධයෙන් පනවන ලද සීමා, අත්‍යවශ්‍යය නොවන ගමන් සීමා කිරීම සංචාරක කර්මාන්තයේ අඩාලවීමට ප්‍රධාන වශයෙන් බලපෑවේය. මෙම තතත්වය තුළින් සංචාරක හෝටල් කර්මාන්තය මෙන් ම ඒ හා සම්බන්ධ අනෙකුත් ව්‍යාපාර ගණනාවක සේවයේ නිරතව සිටි පුද්ගලයින් දහස් ගණනකට තම රැකියා අවස්ථා අහිමි විය.

මූලික වශයෙන් ඉහතින් සඳහන් කරන ලද අංශයන්ට ඇති වූ බලපෑම හැරුණු විට ආර්ථිකයේ සමස්ත ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් මෙමගින් දැඩි සෘණාත්මක බලපෑමක් ඇති කළ අතර විශේෂයෙන් රජයේ සේවකයන් වැනි නිත්‍ය ආදායම් ලබන ක්ෂේත්‍රයන්හි අදාළ පුද්ගලයින් හැරුණු කොටගෙන පුද්ගලික අංශයේ, ස්වයං රැකියාවල නියුතු සහ විශේෂයෙන් ඉදිකිරීම් හා අවිධිමත් අංශයේ දෛනික කම්කරු රැකියාවල නියුක්ත පිරිස් මෙම තත්ත්වය හමුවේ දැඩි ආර්ථික ගැටලුවලට මුහුණු දුන්හ.

වසංගත තත්ත්වය හේතුකොට ගෙන විශේෂයෙන් ම දරිද්‍රතාවයෙන් පෙළෙන ජනතාව මුහුනදෙන ආර්ථික අපහසුතාවලට යම් සහනයක් සැපයීමේ අරමුණ ඇතිව රජය විසින් මූලික ක්‍රියාමාර්ගයන් කිහිපයක් අනුගමනය කරන ලදී. මේවා අතර අඩු අදායම්ලාභී පවුල්වලට/ සමෘද්ධිලාභීන්ට මුදල් සහනාධාර ලබාදීම වැදගත් වේ. මේ අනුව මැයි සහ ජූනි මාසවල දී රුපියල් 5000ක දීමනාවක් මෙම පවුල්වලට ලබාදුන් අතර පසුව මෙම දීමනාව වැඩිහිටියන් ස්වයං රැකියා කරන්නන් සහ වකුගඩු රෝගීන් සඳහා ද ලබාදීමට කටයුතු කරන ලදී. කෙසේ වෙතත් මැතිවරණයක් ප්‍රකාශකර තිබුණු මෙම අවධියේ මෙවැනි දීමනාවක් රජය විසින් ලබාදීම රජයට මැතිවරණයේදී වැඩි වාසි සහගත තත්ත්වයක් උදාකරලීමට හේතුවන්නේ යැයි ස්වාධීන මැතිවරණ කොමිසම විසින් තීරණය කිරීම නිසා මෙම දීමනාව ලබාදීම අත්හිටුවීමට පියවර ගනු ලැබිණි.

මෙයට අමතරව පෞද්ගලික අංශයේ රැකියාලාභීන්ගේ රැකියා අවස්ථා සුරක්ෂිත කිරීම සහ මෙම කාලසීමාවේ ඔවුන්ට මූලික අදායමක් ලැබීම සහතික කිරීම සඳහා කිසිදු සේවකයකුගේ රැකියාව අහිමි නොකරන මෙන් රජය ඉල්ලා සිටි අතර ඔවුන්ට ලබා දිය යුතු අවම වැටුපක් පිළිබඳ සීමාවක් ද පනවනු ලැබිණි.

විදුලි බිල්පත් සහ ජල බිල්පත් සඳහා සහන ලබාදීම ද විදුලි බිල්පත් නො ගෙවීම හේතු කොටගෙන සිදු කරනු ලබන විදුලිය විසන්ධි කිරීම් මාස තුනක කාල සීමාවක් සඳහා අත් හිටුවීමට තීරණය කිරීම ද මෙහි දී පොදු ජනතාවට ලබාදුන් සහන වශයෙන් සැලකි ය හැකිය. එසේම වාහන සඳහා විශේෂයෙන් පොදු ප්‍රවාහන පාසල් බස් රථ සහ ත්‍රී වීල් රථ සඳහා ලබාගෙන තිබෙන කල්බදු සඳහා බදු වාරික මස 6ක කාලයක් සඳහා අත් හිටුවීමට කල්බදු ආයතනවලට නියෝගකිරීම වෙළඳ සහ සුලු ව්‍යාපාර සඳහා ලබා දී තිබෙන ණය වාරික අයකිරීමේ සහන ආදිය ද මෙයට ඇතුළත් වේ.

ආර්ථික අංශය හැරුණු විට COVID-19 වසංගතය තුළින් වැඩිම බලපෑමක් ඇති වූ අංශය ලෙසට අධ්‍යාපන ක්ෂේත්‍රය නම් කළ හැකි ය. ඉතාලි ජාතික සංචාරකයින්ට මගපෙන්වන්නෙකු වශයෙන් කටයුතු කළ ශ්‍රී ලාංකික සංචාරක මගපෙන්වන්නෙකුට වෛරසට අසාදනයවීම වාර්තාවීමත් සමග ම මාර්තු මස 10වැනි දින රජයේ පාසල් සහ රජයේ විශ්වවිද්‍යාල ඇතුළුව පෞද්ගලික පාසල් හා අතිරේක පන්ති ද ඇතුළුව සියලුම අධ්‍යාපන ආයතන වසා දමනු ලැබිණි.

ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය සම්බන්ධයෙන් සැලකිල්ලට යොමු කරන විට රජයේ පාසල් පද්ධතියට අද්විතීය ස්ථානයක් හිමි වේ. පාසල් ළමුන්ගෙන් අතිවිශාල බහුතරයක් රජයේ පාසල්වල අධ්‍යාපනය ලබන අතර සමස්ත පාසල් සංඛ්‍යාව 10500 කට ආසන්නය. පාසල් වසා දැමීමෙන් අධ්‍යාපනයට සිදු වූ හදිසි බලපෑම තුලනය කිරීම සඳහා ප්‍රමාණවත් කිසිඳු විකල්ප ක්‍රියාමාර්ගයක් නොමැති වූ අතර පසුකාලීනව දුරස්ථ අධ්‍යාපන ක්‍රම ශක්තිමත් කිරීම සඳහා පියවර කිහිපයක් ගන්නා ලදී. මේවා ලෙසට රූපවාහිනී නාලිකාවන් අධ්‍යාපන වැඩසටහන් විකාශය සඳහා වෙන් කිරීම හා ඔන්ලයින් අධ්‍යාපනය ප්‍රචලිත කිරීම සඳහා උත්සාහ දැරීම හැඳින්විය හැකි ය.

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය විෂය මූලික සහ විභාග ඉලක්ක කරගත් අධ්‍යාපන ක්‍රමවේදයක් බවට පොදුවේ පිළිගැනීමට ලක් වී ඇති අතර මෙම පද්ධතිය කඩිනම් සංශෝධනයන්ට ලක්විය යුතු බව අධ්‍යාපනඥයින්ගේ මතය වේ. මූලික වශයෙන් දේශන ස්වරූපයකින් යුත් සම්ප්‍රදායික ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන ව්‍යුහයකින් සමන්විත මෙම අධ්‍යාපනය ක්‍රමයට විකල්පයක් වශයෙන් හඳුන්වා දුන් අන්තර්ජාලය පදනම් කරගත් දුරස්ථ මාර්ගික අධ්‍යාපනයකට සිසුන් සහ ගුරුවරුන් කොතරම් දුරට සාර්ථකව අනුගතවේ ද සහ එයින් ප්‍රතිලාභ ලබාගැනීමට සමත්වේ ද යන්න ගැටලුවක් වේ.

මෙයට අමතරව මෙම නව තාක්ෂණයන් සඳහා අවශ්‍ය යටිතල පහසුකම්, තාක්ෂණික දැනුම හා කුසලතාවයන් ඒ සඳහා වැය වන පිරිවැය දැරීමේ හැකියාව අවශ්‍ය අධ්‍යාපන ආධාරක

මෙන් ම අදාළ කුසලතාවන්ගෙන් හෙබි මානව ප්‍රාග්ධනය සපයා ගැනීම ද කැපී පෙනෙන අභියෝගයන් ලෙස පවතී. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල සිසුන් අන්තර්ජාලය පදනම් කරගත් අධ්‍යාපනයෙන් කොතරම් දුරට ප්‍රතිලාභ ලබා ගන්නේ ද යන්න පිළිබඳව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය මගින් සිදු කරන ලද සමීක්ෂණයක දී අනාවරණය වූයේ මෙම ක්‍රමයෙන් නිසි ඵල ලබාගැනීමට සමත් විශ්වවිද්‍යාල සිදුන්ගේ ප්‍රතිශතය 30%ක් බව ය.

ප්‍රධාන වශයෙන් ඉහතින් සඳහන් කරන ලද තත්ත්වයන් හමුවේ ශ්‍රී ලංකාවේ මිලියන 20ක ජනතාව අතර අඩු ආදායම්ලාභී පවුල් සහ එහි දරුවන්, කාන්තාවන් ගෘහමූලිකත්වය දරණ කුටුම්භ, අවදානම් තත්ත්වයේ සිටින තරුණයින්, විශේෂ අවශ්‍යතා සහිත ප්‍රජාව ඇතුළු ආන්තීකරණය වූ සමාජ කණ්ඩායම්වලට සෞඛ්‍යමය, ආර්ථික, රැකවරණය සහ සමාජ ආරක්ෂාව පිළිබඳ අභියෝග ඇති කරමින් සෑම ක්ෂේත්‍රයක් තුළ ම ව්‍යුහාත්මක අසමානතාවය වර්ධනය කිරීමට නව කොරෝනා වෛරසය සමත් වී ඇත. ඒ අනුව බොහෝ සමාජ විද්‍යාඥයින් අවධාරණය කරන පරිදි කොරෝනා වසංගත තත්ත්වය තුළ ලෝකයේ වැඩිම වින්දිතයින් බවටපත් වී සිටින්නේ අවධානම් තත්ත්වයන් තුළ සිටින, සමාජයේ අඩු වරප්‍රසාද සහිත ළමුන්, තරුණයින් සහ කාන්තාවන් ය. පාසල් සහ උසස් අධ්‍යාපන ආයතන වසාදැමීම, සමාජ දුරස්ථ භාවය සහ නිවෙස් තුළට සීමාවීමට සිදුවීම, ගෘහස්ථ හිංසනයට ළමුන් සහ කාන්තාවන් නිරාවරණය වීම, පෝෂණ ඌනතාවයන් ඇතිවීමේ අවදානම, කාංසාව සහ ආතතිය වැනි දුර්වල මානසික තත්ත්වයන්ට නිරාවරණය වීම, සෞඛ්‍ය සහ සත්කාරක සේවා සඳහා අඩු ප්‍රවේශය ඔවුන් තවදුරටත්" අවදානම්කාරී ප්‍රජාව" යන කුලකය තුළ සිරගතකොට තබන සාධකයන් වේ.

පාසල් සහ අනෙකුත් අධ්‍යාපන ආයතන තාවකාලිකව වසා දැමීම හේතුවෙන් අධ්‍යාපන ක්‍රම දුරස්ථ අධ්‍යාපනයට මාරු වීමත් සමග ඩිජිටල් තාක්ෂණයට ප්‍රවේශ වීමට පහසුකම් සහ සම්පත් නොමැති සිසුන් අධ්‍යාපනය තුළ සැලකිය යුතු අන්දමින් පසුගාමී වී තිබේ. ඇති වී තිබෙන මූල්‍ය ගැටලු හේතුවෙන් දුරස්ථ අධ්‍යාපන ක්‍රමයට හැඩගැසීමට අදාළ ප්‍රජාවට නොහැකි වී තිබේ. එම නිසා තම නිවෙස් සහ ගෙවත්ත යන සීමිත අවකාශයකට සිය සංචරණයන් සීමා වීම හේතුවෙන් ආන්තික ප්‍රජාවේ බොහෝ තරුණ තරුණියන් ආතතිය වැනි මානසික ගැටලුවලට මෙන් ම, පවතින ක්‍රමයට අනුගත වීමට නොහැකි වීම සහ ඒ සඳහා දක්වන පසුගාමීත්වය හේතුවෙන් සමාජ විරෝධී ක්‍රියාවන්වලට යොමුවීමේ ප්‍රවණතාවයක් දක්නට ලැබේ.

ශ්‍රී ලංකාවේ "ජාතික තරුණ සේවා සභාව (2010) වර්ෂයේ තරුණයෙකු අර්ථකථනය කර ඇත්තේ අවුරුදු 15-29ත් අතර වයස්කාණ්ඩයට අයත් ගැහැනු ළමුන් සහ පිරිමි ළමුන් ය. නමුත් මෙම අධ්‍යයනය තුළ සිද්ධි අධ්‍යයනයන් සඳහා වැඩි වශයෙන් ම අවධානය යොමුකරන ලද්දේ අවුරුදු 15-29ත් අතර පාසල් යන වයසේ හෝ උසස් අධ්‍යාපනය හදාරන තරුණ ප්‍රජාව කෙරෙහි ය. COVID-19 වසංගත තත්ත්වය තුළ පාසල් ළමුන්ගේ අධ්‍යාපනය, තරුණයින්ගේ රැකියා ව්‍යුක්තිය, අඩු ආදායම්ලාභී පවුල්වල ආදායම් තත්ත්වය පිළිබඳව දත්ත නොමැති වූ බැවින් අධ්‍යයනයේ දත්ත කෙරෙහි පමණක් සීමාවීමට සිදු විය.

ආන්තිකරණය යනුවෙන් මූලික වශයෙන් හැඳින්වෙන්නේ ආර්ථික, සමාජයීය, දේශපාලනික ආගමික යනාදී කරුණු මත යම් ප්‍රජාවක් හෝ කණ්ඩායමකට සමාජයේ අනෙකුත් පුද්ගලයින් විසින් සාමාන්‍යයෙන් භුක්ති විඳිනු ලබන පහසුකම්, වරප්‍රසාද සහ අයිතිවාසිකම් නොලැබීම මත ඇති වන අවාසිදායක තත්ත්වයයි. ආන්තිකරණයේ ප්‍රතිඵල ලෙස රැඩිකලීකරණය සහ අවසාන වශයෙන් ප්‍රචණ්ඩකාරී අන්තවාදයට යොමුවීම සිදුවිය හැකි ය. ප්‍රචණ්ඩ අන්තවාදයට පුද්ගලයන් පොලඹවන සාධක, එනම් ආන්තිකරණය, අසමානතාවය, වෙනස් කොට සැලකීම, ගුණාත්මක හා අදාළ අධ්‍යාපනයට ඇති සීමිත ප්‍රවේශය; අයිතිවාසිකම් සහ සිවිල් නිදහස ප්‍රතික්ෂේප කිරීම; හා සමාජ ආර්ථික දුක්ගැනවිලි ඇතුළත් වේ.

ශ්‍රී ලංකාවේ දී මෙම තත්ත්වයන් මත 1971 සහ 1988-89 වසරවල දී තරුණ කැරලි ගැසීම් පැන නැගුණු අතර මෙමගින් තරුණ ජීවිත රැසක් අහිමි වීම සහ විශාල ආර්ථික සමාජයීය හානියක් සිදු විය. රටක සංවර්ධනයට, සාමකාමී වාතාවරණයට බාධාවන් පමුණුවන තත්ත්වයන් ඇති වීමට මූලික බලපෑමක් සිදුකරන්නා වූ සාධක වශයෙන් විශේෂයෙන් ආර්ථික ගැටලු සහ එම ආර්ථික ගැටලුවලට සාර්ථකව මුහුණදීමටත් ආර්ථික සමාජයීය යහපැවැත්ම සඳහා පදනම සකසන්නා වූ අධ්‍යාපනයට ප්‍රවේශවීමට ඇති අවස්ථාවන් විශේෂයෙන් ම දරිද්‍රතාවයෙන් සහ ආන්තිකරණයට ලක් වූ ප්‍රජාවන්ට අහිමිකරන්නා වූ උපනතියක් මෙම වසංගත තත්ත්වය හමුවේ නිර්මාණය වී තිබේ.

ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 5ක ආන්තිකරණයට ලක් වූ අඩු වරප්‍රසාද සහිත කුටුම්භයන්හි තරුණ ප්‍රජාව ඉලක්ක කරගෙන ක්‍රියාත්මක කරන ලද මෙම තරුණ ක්‍රියාකාරී සමීක්ෂණයෙහි මූලික පරමාර්ථය වනුයේ COVID-19 වසංගත තත්ත්වය හේතුවෙන් ශ්‍රී ලංකාවේ ආන්තිකරණය වූ ප්‍රජාවට, විශේෂයෙන් ම තරුණයින්ට ඇති වී තිබෙන බලපෑම පිළිබඳව විමසා බැලීමටත් එම ප්‍රජාව හරහා එම ගැටලුවලට විසඳුම් යෝජනා ලබා ගැනීමත් ය. මෙම අධ්‍යයනය "ආසියා පැසිෆික් කලාපීය මූලික සහ වැඩිහිටි අධ්‍යාපනය (ASPBAE) ආයතනයේ මූල්‍ය සම්පාදනයෙන් සහ අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ (CED) අධීක්ෂණය සහ මෙහෙය වීමෙන් ක්‍රියාවට නංවන ලදී. මෙම තරුණ ක්‍රියාකාරී සමීක්ෂණය සඳහා අඩු වරප්‍රසාද සහිත, අවධානම්කාරී ප්‍රජාවෙහි තරුණ තරුණියන් විසින් සිදුකරන ලද ව්‍යුහාත්මක සම්මුඛ සාකච්ඡා සහ ඉලක්කගත කණ්ඩායම් සම්මුඛ සාකච්ඡා හරහා ලබාගන්නා ලද ප්‍රාථමික දත්ත පාදක කරගන්නා ලදී.

COVID-19 වසංගත තත්ත්වය යම් දිනෙක ලෝකයෙන් තුරන් වී යාහැකිය. නමුත් ඊට වඩා ප්‍රබල වසංගත, ස්වාභාවික විපත්, සතුරු ප්‍රහාර හෝ කිසිඳු දිනෙක අපේක්ෂා නොකරන මහ විපත් හෝ විනාශකාරී තත්ත්වයන් අනාගතයේ ඇති විය හැකි ය. එවැනි වසංගත තත්ත්වයන් හමුවේ ද ළමුන්ගේ අධ්‍යාපනය අඛණ්ඩව පවත්වාගෙන යායුතු අතර තරුණයින්ට අඛණ්ඩව ආර්ථික ක්‍රියාකාරකම්වල නියැලීමට අවකාශය තිබිය යුතු ය. මේ සියල්ල ඉටුකළ යුත්තේ රටට ගැළපෙන සහ වෙනස්වන තත්ත්වයන්ට පරිනාමනය විය හැකි අධ්‍යාපන ක්‍රමයක් හරහා ය. ඒ සඳහා තරුණයින් විසින් සිදුකරන ලද නිර්දේශ මෙම වාර්තාව තුළ අන්තර්ගතව ඇත.

## 2. පර්යේෂණ අරමුණ

මෙම පර්යේෂණයේ අරමුණ වූයේ කොරෝනා වසංගත තත්ත්වය නිසා තරුණ පරපුරට විශේෂයෙන් ම ආන්තීකරණයට ලක් වූ තරුණයන්ට අධ්‍යාපනය ලබාගැනීම සම්බන්ධයෙන් මුහුණ දීමට සිදු වී ඇති සෘණාත්මක බලපෑම පිළිබඳව අධ්‍යයනයට ලක් කිරීම ය. මෙයට අමතරව එමගින් ඔවුන්ට ඇති වී තිබෙන ආර්ථික සහ සමාජයීය බලපෑම් ද ඒවා සමනය කරගැනීම සඳහා ඔවුන් විසින් අනුගමනය කරන ලද කලමනාකරණ උපක්‍රමද පිළිබඳව ද මෙහි දී අවධානයට ලක්කර තිබේ. එමෙන් ම වසංගත තත්ත්වය හේතුවෙන් ඇති වූ ගැටලු විසඳා ගැනීමට අධ්‍යාපනය උපකාර කරගත හැකි ආකාරය පිළිබඳව තරුණයින්ගේ නිර්දේශ ලබාගැනීමත් ඒ හරහා ඉදිරියේ දී අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ඇති කළ යුතු ප්‍රතිසංස්කරණ පිළිබඳව අදාළ වගකිවයුතු නිලධාරීන්ගේ අවධානය යොමුකිරීමත් මෙම තරුණ ක්‍රියාකාරී සමීක්ෂණය හරහා මූලික වශයෙන් බලාපොරොත්තු වේ.

## 3. ක්‍රමවේදය

පර්යේෂණය සැලසුම් කළ සහ ක්ෂේත්‍ර අධ්‍යයන කටයුතු සිදු කරන ලද කාල සීමාවේ COVID-19 වසංගත තත්ත්වය පැතිර යමින් පැවති බැවින් තොරතුරු එක්රැස් කිරීම සම්බන්ධයෙන් ප්‍රායෝගික විකල්ප ක්‍රමවේද හඳුනාගැනීම පිළිබඳව මෙහි දී අවධානය යොමු කරන ලදී. මූලික වශයෙන් අර්ධ ව්‍යුහගත ප්‍රශ්නාවලියක් මගින් තොරතුරු ලබාග ැනීමට අපේක්ෂා කරන ලද අතර සංචරණ සීමාවන් පනවා තිබුණු හෙයින් දුරස්ථ මාර්ගිකව තොරතුරු රැස්කිරීමට ද අවධානය යොමුවිණි.

කෙසේ වුව ද ජූනි මස මුල් භාගය වන විට ශ්‍රී ලංකාවේ COVID-19 වසංගතය සාර්ථකව පාලනය කිරීමට අදාළ බලධාරීන්ට හැකි වූ බැවින් තොරතුරු එක්රැස් කිරීම ප්‍රධාන වශයෙන් මුහුණුට මුහුණලා සිදුකරන ලද සම්මුඛ සාකච්ඡා ඇසුරින් සිදු කිරීමට හැකි විය.

ප්‍රතිචාරකයින්ගේ සමාජ ආර්ථික පසුබිම මනාව නිරූපණය වීම සඳහාත් ඔවුන්ගේ අත්දැකීම් සජීවීව තථ්‍යාකාරයෙන් ඉදිරිපත් කිරීමටත් සහ අධ්‍යයනයේ වාර්තාව, වාර්තාමය චිත්‍රපටයක් ආකාරයට සැකසීමට අපේක්ෂා කරන ලද බැවින් ප්‍රතිචාරකයින්ගෙන් ලබාගත් කැමැත්ත මත සියලු ම සම්මුඛ සාකච්ඡාවන් වීඩියෝ පටිගත කිරීමට කටයුතු කරන ලදී.

අර්ධ ව්‍යුහගත ප්‍රශ්නාවලිය ඇසුරෙන් සිදු කරන ලද සම්මුඛ සාකච්ඡාවන් ඇසුරින් සිද්ධි අධ්‍යයන වාර්තාවක් සකස් කිරීම පර්යේෂකයින් විසින් සිදු කරන ලද අතර තොරතුරු විශ්ලේෂණය සඳහා මෙම සිද්ධි අධ්‍යයන වාර්තා මෙන් ම වීඩියෝ දර්ශන ද යොදා ගැනීම සිදු විය.

## 4. නියැදිය

අධ්‍යයනයේ අරමුණුවලට අදාළව තොරතුරු එක්රැස් කිරීම සඳහා සමාජ ආර්ථික දෘෂ්ටිකෝණයකින් සැලකිලිමත්ව අවධානය යොමුකරමින් නියැදිය තෝරාගැනීමට කටයුතු කරන ලදී. ශ්‍රී ලංකාවේ මූලික වශයෙන් ආන්තීකරණයට ලක් වී සිටින සමාජ කණ්ඩායම් පහක් දැකිය හැකි ය. එනම් වතුවැවිලි ආශ්‍රිත ප්‍රජාව, අබාධිත ප්‍රජාව, ලිංගික විපරිනාමයට ලක් වූ සහ සමලිංගික කණ්ඩායම්, දරිද්‍රතාවයෙන් පෙළෙන ග්‍රාමීය ජන කණ්ඩායම් සහ නාගරික පැල්පත්වාසීන් සැලකිය හැකි ය. භාෂාමය තත්ත්වයන් සහ සමාජ පිළිගැනීම යන සුවිශේෂී තත්ත්වයන් නිසා හැරුණු විට මෙම සියලු ම ප්‍රජාවන් ආන්තීකරණයට ලක් වීමට හැකි පොදු සාධකය ලෙසට දරිද්‍රතාවය නම් කළ හැකි වේ.

මෙම මූලික සාධකයන් ආවරණය වන ආකාරයට නියැදිය සඳහා ඉහතින් සඳහන් කරන ලද ප්‍රජාවන්ට අයත් වයස අවුරුදු 15-29 යන වයස් කාණ්ඩයේ පසු වන තරුණ තරුණියන් 20 දෙනෙකු මෙහි දී තෝරාගන්නා ලදී. මෙහිදී පාසල් අධ්‍යාපනය, විශ්වවිද්‍යාල/තෘතියික අධ්‍යාපනය ලබන තරුණ තරුණියන් සම්බන්ධකර ගැනීම සඳහා විශේෂ අවධානයක් යොමු කිරීම සිදු විය.

ඒ අනුව තෝරාගන්නා ලද නියැදිය පහත වගුවේ දැක්වේ

| ප්‍රජා කණ්ඩායම | ස්ත්‍රී | පුරුෂ |
|---|---|---|
| දරිද්‍රතාවයෙන් පෙළන ග්‍රාමීය | 2 | 3 |
| නාගරික පැල්පත්වාසීන් | 3 | 1 |
| වතු වැවිලි ආශ්‍රිත ප්‍රජාව | 3 | 2 |
| ලිංගික විපරිනාමයට පත් වූ සහ සමලිංගික | 2 | |
| ආබාධිත | 2 | 2 |

අධ්‍යයනය සඳහා තෝරාගන්නා ලද නියැදියට COVID-19 වෛරසය අසාදනය වූ සහ ආසාදනය වී ඇතැයි සැකය මත නිරෝධායන මධ්‍යස්ථනවලට යොමු කරන ලද තරුණ තරුණියන් 04 දෙනෙකු ද ඇතුළත් බව මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුතු වේ. අදාළ පුද්ගලයින්ගෙන් තොරතුරු එක්රැස් කිරීමේ දී රජයේ පරිපාලන සහ සෞඛ්‍ය බලධාරීන්ගෙන් මේ සඳහා ලද අවසරය හා සහයෝගය මෙහි දී සිහිපත් කළ යුතු වේ.

## 5. අධ්‍යයනයේ සීමාකාරී සාධක

- COVID-19 වසංගත තත්ත්වය නිසා සංචරණ කටයුතු සීමා කර තිබීම, මේ සඳහා වෙන් කරන ලද අරමුදල් ප්‍රමාණය සීමා වීම යනාදී සාධක හේතු කොටගෙන අධ්‍යයන නියැදිය පුද්ගලයින් 20 දෙනෙකුට සීමා කිරීමට සිදු විය.

- ශ්‍රී ලංකාවේ ආන්තීකරණය වූ තරුණයින්ගේ අධ්‍යාපනයට COVID-19 වසංගත තත්ත්වය නිසා සිදු වූ බලපෑම පිළිබඳ මෙම අධ්‍යයනය සීමිත නියැදියක් ඇසුරෙන් සිදු කරන ලද බැවින් එමගින් සොයාගන්නා ලද කරුණු රටේ සමස්ථ තරුණ පරපුර සම්බන්ධයෙන් ප්‍රතිශතක ලෙස ආදේශකර අදහස් දැක්වීමට නො හැකි වේ.

- සම්මුඛ සාකච්ඡා වීඩියෝ පටිගත කිරීම පිළිබඳව ප්‍රතිචාරකයින්ගේ කැමැත්ත ලබා ගැනීම දුෂ්කර කාර්යයක් විය. COVID-19 වසංගත කාලය තුළ ජනමාධ්‍ය ආයතන සහ සමාජ මාධ්‍ය විසින් පුවත් සහ තොරතුරු ප්‍රචාරය කිරීමේ දී ව්‍යාජ තොරතුරු සහ ජනතාව නොමග යවන සුලු වැරදි අර්ථකතන සිදුවන ආකාරයට ඡායාරූප හා වීඩියෝ භාවිත කිරීම තුළින් ඉලක්කගත ප්‍රජාව අපහසුතාවන්ට ලක්වීම මෙයට හේතු වී ඇත.

- කෙසේ වෙතත් එක් එක් ආන්තීකරණ කණ්ඩායම් නියෝජනය කරනු ලබන පුද්ගලයින් සමග සිදු කරන ලද ගැඹුරු සිද්ධි අධ්‍යනයන් සමූහයක් ඇසුරින් සිදු කර තිබෙන මෙම අධ්‍යයනය මෙවැනි අනපේක්ෂිත වාතාවරණයන්හි දී ප්‍රජාවන් මුහුණපාන විවිධාකාර වූ ගැටලු පිළිබඳව හා ඒවා විසඳීම සඳහා ක්‍රියාවට නංවනු ලබන සාර්ව විසඳුම් ක්‍රියාමාර්ග අදාළ පාදක ප්‍රශ්නවලට කොතරම් දුරට ඵලදායීව පිළිතුරු සපයන්නේදැයි තක්සේරු කරගැනීම සඳහා කදිම පසුතලයක් නිර්මාණය කරනු ලබයි.

## 6. ප්‍රතිඵල විශ්ලේෂණය

මාර්තු මස මුල්භාගයේ දී ශ්‍රී ලංකාවේ COVID-19 වසංගත තත්ත්වය හමුවේ පොදුවේ ශ්‍රී ලංකාවේ ජනතාවට මහත් පීඩාකාරී වාතාවරණයකට මුහුණ දීමට සිදු විය. ප්‍රථමයෙන් ම මාර්තු මස මුල් භාගයේදී පාසල් වසා දැමීමත් දෙවනුව සමාජයේ අනෙකුත් අංශවල ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් පනවන ලද සීමාවන් ද හේතුකොටගෙන සියලු ම ප්‍රජාව අපහසුතාවයට පත්විණි. COVID-19 ආසාදනය වූ පුද්ගලයින් මූලික වශයෙන් වාර්තා වූයේ බස්නාහිර පළාතේ කොළඹ, ගම්පහ සහ කළුතර දිස්ත්‍රික්කවලින් වුව ද වසංගත තත්ත්වය නිසා රටේ උද්ගතවිය හැකි බරපතළ ආපදා තත්ත්වයන් වළක්වාගැනීමේ පූර්ව උපායයන් වශයෙන් බලධාරීන් රටපුරා නිරෝධායන ඇඳිරිනීතිය ක්‍රියාත්මක කරන ලද බැවින් සමස්තයක් වශයෙන් මුළු දිවයින ම සමාජීය හා ආර්ථික වශයෙන් අක්‍රීය තත්ත්වයට පත්විණි. අත්‍යවශ්‍යය රාජකාරී ලෙස හැඳින්විය හැකි සෞඛ්‍ය හා ආරක්ෂක සේවාවන්ට සම්බන්ධ පිරිස් හැරුණු විට සියලු ම පුද්ගලයින්ට නිවාසවලට වී සිටින ලෙසට උපදෙස් දෙනු ලැබූ අතර පොදුවේ කෘෂිකාර්මික කටයුතුවල නියැලීමට අවසර හිමි විය.

මෙම තත්ත්වය හමුවේ පොදුවේ හා සුවිශේෂී වශයෙන් අධ්‍යාපනයටත් ඇතිවූ බලපෑම මූලික වශයෙන් ආර්ථික, සමාජයීය වශයෙන් බෙදා දැක්විය හැකි ය. ඒ අනුව අප විසින් සලකා බලනු ලබන තරුණ ප්‍රජාවට වසංගතයෙන් සිදු වූ බලපෑම ද ඉහත දක්වන ලද ප්‍රධාන අංශයන් ඇසුරින් මෙහි දී සාකච්ඡා කර තිබේ.

ශ්‍රී ලංකාවේ ආන්තීකරණයට ලක් වූ ප්‍රජාවන් ග්‍රාමීය සහ නාගරික යන දෙඅංශයෙන් ම වාර්තා වේ. නාගරික හා ග්‍රාමීය වශයෙන් ආන්තීකරණයට ලක්වී සිටින ප්‍රජාවන්ගේ පොදු ලක්ෂණය වන්නේ දරිද්‍රතාවයයි. එදිනෙදා ජීවන අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රමාණවත් අදායම් ජනිත කිරීමට ප්‍රමාණවත් ජිවනෝපාය මාර්ග සතු නොවීමත් බෙහෝවිට නිත්‍ය නොවන අස්ථාවර හා නොවිධිමත් ආර්ථික අංශයේ රැකියාවන්හි නිරත වීම මෙම ප්‍රජාවන් තුළින් දක්නට ලැබේ. මෙම අධ්‍යයනයේ දී නාගරික හා ග්‍රාමීය ප්‍රජාව නියෝජනය කරන තරුණයින් 20 දෙනෙකු සමග සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී.

ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවන්හි ප්‍රධාන වශයෙන් දක්නට ලැබෙන ජනගහන සංයුතියේ ඒකාත්මකතාවන් සහ සහ විවිධත්වය මෙම ප්‍රජාවන් ඇසුරෙන් ද විද්‍යමාන වේ. COVID-19 වසංගත තත්ත්වය හමුවේ අධ්‍යාපනය ලබා ගැනීම සම්බන්ධයෙන් සිදු වූ බලපෑම් මෙම සාර්ව සාධකයන්හි බලපෑමෙන් පූර්ණ වශයෙන් මිදී නොමැති බව අධ්‍යයනයේ දී පැහැදිලි විය.

## COVID-19 වසංගතය පිළිබඳව තරුණ තරුණියන් අතර පවත්නා අවබෝධය හා දැනුම්වත්භාවය

අධ්‍යයනයට සහභාගී වූ තරුණ තරුණියන් සියලුදෙනා ම COVID-19 වසංගතයේ ව්‍යාප්තිය හා එමගින් ඇතිවන සෞඛ්‍යමය ගැටලු පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබාගෙන සිටියහ. ග්‍රාමීය සහ නාගරික වශයෙන් මෙම දැනුම්වත්භාවයේ කැපී පෙනෙන වෙනස්කම් දක්නට නොලැබුණු අතර රෝග ව්‍යාප්තිය, රෝග නිවාරණ ක්‍රම, ප්‍රතිකාර සහ එමගින් සමස්ත ලෝකයට ඇති වන ආර්ථික සමාජයීය බලපෑම් පිළිබඳ ප්‍රමාණවත් අවබෝධයක් ඔවුන් ලබාගෙන තිබුණි. අධ්‍යයනයට භාජනය වූ කණ්ඩායම් අතරින් මෙම දැනුම් ප්‍රමාණයේ යම් අඩුවක් දක්නට ලැබුනේ පිළිවෙලින් ආබාධිත තරුණ ප්‍රජාව සහ වතුවැවිලි ආශ්‍රිත ප්‍රජාව ඇසුරෙන් පමණි. ප්‍රධාන මාධ්‍ය ඔස්සේ සිදුකරන ලද මෙම දැනුම්වත් කිරීම් ලබාදෙන දැනුම ඔවුන් වෙත සම්ප්‍රේෂණයවීමේ දී ඇති වන භාෂාමය ගැටලු සහ සන්නිවේදන මාධ්‍ය ඔවුන්ගේ අවශ්‍යතාවන්ට ගෝචර නොවීම මෙම තත්ත්වය උද්ගත වීමට යම් බලපෑමක් සිදු කර තිබේ.

ප්‍රධාන මාධ්‍ය දහරාවන් ඔස්සේ සිදු කරන ලද දැනුම්වත් කිරීම මූලික වශයෙන් සිංහල මාධ්‍යයෙන් සිදු වීමත් ශ්‍රව්‍ය හා දෘශ්‍ය ආබාධිත පුද්ගලයින් සඳහා මෙම සෞඛ්‍ය පණිවිඩ ලබාදීමේ විකල්ප ක්‍රම පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් ලක් නොවීම මෙහි දී පැහැදිලිව අනාවරණය විය.

විධිමත් අධ්‍යාපන ක්‍රමයන්ගෙන් බැහැර නොවිධිමත් අධ්‍යාපන ක්‍රමවේදයන් ඔස්සේ සිදු කරන ලද මෙම දැනුම්වත් කිරීම් සමාජයේ සියලු ම කාණ්ඩයන්ට මෙම වසංගත තත්ත්වයේ බලපෑම එයින් මිදී සිටීමට ගත යුතු පියවර සහ මේ සම්බන්ධයෙන් සහන ලබා දීමට ක්‍රියාත්මක කර තිබෙන වැඩපිළිවෙළ සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවබෝධයක් ලබා දීමට හැකි වී තිබෙන බව මෙහිදී පැහැදිලි විය.

## 7. COVID-19 වසංගතය හේතුවෙන් ඇති වූ ආර්ථික බලපෑම

වසංගත තත්වයන් පැතිරීයාම වැළැක්වීම උදෙසා රජය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ගයන්හි වැඩිම බලපෑම ඇතිවූයේ ආර්ථික ක්‍රියාකාරකම්වලට ය. ආර්ථිකයේ ප්‍රධාන අංශයන් වන නිෂ්පාදන හා සේවා යන අංශ දෙකට ම මෙමගින් දැඩි බලපෑම් ඇති විය. ආර්ථිකයට ඇති වූ බලපෑම හමුවේ එයට මුහුණදීම සඳහා රජය සහ පෞද්ගලික අංශය විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කරන ලදී. පෞද්ගලික අංශය මෙම තත්ත්වය හමුවේ පියවරගණනාවක් ගන්නා ලද අතර අතිරේක සේවකයින් ඉවත් කිරීම, සේවා වැඩමුර සංඛ්‍යාව සීමා කිරීම, අතිකාල දීමනා, අතිරේක දීමනා අත්හිටුවීම, මාසික වැටුපෙන් ප්‍රතිශතයක් පමණක් ලබා දීම යනාදිය හැඳින්විය හැකිය. රජයේ සේවකයින්ගේ වැටුප් අඩුකිරීමක් හෝ සේවකයින් ඉවත් කිරීමක් සිදු නොවුන නමුත් අතිකාල දීමනා කපා හැරීම හා අතිකාල වැඩ සීමා කිරීම මෙම සමයේ දී දක්නට ලැබිණි. කෙසේ වෙතත් වසංගතය හමුවේ වුව ද රජයේ සේවකයින්ට එල්ල වූ ආර්ථික බලපෑම අවම මට්ටමක පැවැති බව මෙහි දී සඳහන් කළ යුතු වේ. ඉහතින් සඳහන් කරනු ලැබූවේ ආර්ථිකයේ විධිමත් අංශයේ රැකියාවන්හි නිරත වන නිශ්චිත මාසික ආදායමක් ලබන පුද්ගලයින්ට ඇති වූ පොදු බලපෑම සම්බන්ධයෙන් පැහැදිලි කිරීමකි. කෙසේ වෙතත් මෙවැනි නිශ්චිත මාසික ආදායමක් නොලබන සහ  අඩු ආදායම් ලබන කම්කරු කෘෂිකාර්මික හෝ වෙනත් ක්ෂේත්‍රයන්හි නිරතවන පුද්ගලයින් අතිශය දරුණු ආර්ථික බලපෑමකට මුහුණ දුන්හ.

විශේෂයෙන් ම දෛනික ආදායම් ලබන කම්කරුවන් කෘෂිකාර්මික අංශයේ ශ්‍රමිකයින් සහ ස්වයං රැකියාවන්හි නිරත වූ පිරිස් මෙහි දී වඩාත් අසරණ තත්ත්වයකට පත් විය. මෙම තත්ත්වයට පිළියම් වශයෙන් මැයි සහ ජූනි මාසවල දී සහනාධාරයක් වශයෙන් රුපියල් 5000 ක මුදලක් සමෘද්ධිලාභීන්ට ලබා දීමට රජය කටයුතු කරන ලදී. මෙය පසු අවස්ථාවක දී ස්වයං රැකියා කරන පුද්ගලයින්ට, වැඩිහිටි පුද්ගලයින්ට සහ ආබාධිත ප්‍රජාව වෙත ද ලබා දීමට පියවර ගැනීම සිදු විය. කෙසේ වෙතත් මේ වන විට ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු මැතිවරණය ප්‍රකාශයට පත් කර තිබීම නිසා මෙම සහනාධාර ලබා දීම මගින් පවත්නා රජයට විශේෂ වාසි සහගත තත්ත්වයන් ඇති වන බවට වූ අදහස මත මැතිවරණ කොමිෂන් සභාව විසින් මෙම දීමනා ලබාදීම අත්හිටුවීමට කටයුතු කරනු ලැබී ය.

මෙසේ ලබා දුන් සහනාධාර නිසි ආකාරයෙන් බෙදා නොදුන් බවටත් අකාර්යක්ෂමතා සහ දූෂණ සිදු වූ බවටත් චෝදනා පවතින අතර අධ්‍යයනයේ දී අදහස් දැක්වූ පුද්ගලයන්ගෙන් කිහිප දෙනෙක් ද තමන්ට මෙම සහනාධාර නොලැබුනු බව දන්වා සිටියහ.

“අපි මෙම ප්‍රදේශයේ පදිංචියට ඇවිල්ල මාස 9ක් වෙනවා. මේ ප්‍රදේශයේ COVID-19 වසංගතය පැතිරුණු නිසා අපිට නිරෝධායන මධ්‍යස්ථානවලට යන්න වුනා, ඒ නිසා අපට රජයෙන් ලැබුණු සහනාධාර මොනවාවත් ලැබුනේ නැහැ. ඒවාට ලියාපදිංචි වෙන්න අවස්ථාවක් හමු වුනෙත් නැහැ. මෙහේ ග්‍රාම නිලධාරිගෙන් ඇහුවම එයා කියනවා ඔයාල ස්ථිරව පදිංචි කොට්ඨාසෙ ග්‍රාම නිලධාරීන්ට දැනුම් දෙන්න කියල. ඒ ග්‍රාම නිලධාරී කියන්නේ දැන් ඔයාලා මෙහේ නැති නිසා වගකීමක් ගන්න බැහැ කියලා. කොහොම වුනත් මේ ප්‍රශ්නෙන් වැඩිම බලපෑමක් ඇතිවුණු

අපිට කිසිම සහනයක් නැහැ. මගේ සහෝදරයෝ දෙන්නෙක් පුද්ගලික කර්මාන්ත ශාලාවල සහ පුද්ගලික ආයතනයක වැඩ කළා. දැන් ඒ අයට වැඩ නැහැ. මේ ප්‍රදේශයේ අයට COVID-19 වැළඳුණු බවට ප්‍රසිද්ධ වෙලා තියන නිසා අපට කවුරුවත් වැඩදෙන්නේ නැහැ. අපිට ආධාර නොලැබුණාට අනිත් අය මේ පහසුකම් ලබාගන්නවා" **-නාගරික පැල්පත්වාසී තරුණියක්-**

"අපේ ගෙදර අය නිරෝධායනයට යවන වෙලාවේ අපේ තාත්තා අපිත් එක්ක හිටියේ නැහැ. එයා වෙනත් ප්‍රදේශයක වැඩට ගිහිල්ලා තිබුණේ. මෙහේ ලොක්ඩවුන් කරලා තිබුන නිසා එයාට මෙහෙට එන්න හමුවුනේ නැහැ. ඒ නිසා අපි ගැන තොරතුරු ගන්න ආපු නිලධාරීන්ට අපිව මගහැරුණා. ඉතින් අපිට මෙම සහනාධාර ලබාගැනීමට බැරි වුණා. තාත්තට පසුගිය මාසේටම වැඩ තිබුනේ දවස් 09 කට විතරයි. අම්ම කඩවල්වලට කෑම හදල දාල තමයි අපි ජීවත්වෙන්නේ. ඒත් මේ කරදර නිසා ඒව කරන්න බැහැ" **-නාගරික පැල්පත්වාසී ප්‍රජාවේ පාසල් සිසුවියක්-**

ග්‍රාමීය ප්‍රජාවට සාපේක්ෂව නාගරික ප්‍රජාව තම මූලික අවශ්‍යතා එනම් ආහාර ලබාගැනීමේ දී, එදිනෙදා අවශ්‍යතා ඉටුකරගැනිමේ දී වඩාත් දුෂ්කර තත්ත්වයකට මුහුණදී තිබෙන බව ප්‍රතිචාරකයින්ගේ අදහස් දැක්වීම්වලින් පැහැදිලි විය. අධ්‍යයනයට ලක් වූ නාගරික පැල්පත්වාසී ප්‍රජාව විශේෂයෙන් තම ආහාර පාන නිවසේ සකස් කිරීමට වඩා වෙළඳපලෙන් මිල දී ගෙන පරිභෝජනය කිරීමේ නැඹුරුවක් දක්නට ලැබිණි. කාර්ය බහුල, සංකීර්ණ ජීවන රටාව, නිවසේ ඉඩකඩ ප්‍රමාණවත් නොවීම සහ අවට පරිසරයේ පිසින ලද ආහාර බහුල වශයෙන් පැවතීමත් යන කරුණු මෙම තත්ත්වයට හේතු වී තිබේ.

මෙම කාල සීමාව තුළ දෛනික ආහාරපාන සපයා ගැනීමේ දී ඇති වූ ආර්ථික අපහසුතා සමනය කරගැනීම සඳහා නියැදියේ සිටින ග්‍රාමීය ප්‍රදේශවලට අයත් පවුල්වල ප්‍රතිචාරකයින් ගෙවතු වගාව සඳහා යොමු වී ඇතත් නාගරික කොළඹ නාගරික පැල්පත්වාසී පවුල්වලට එවැනි ක්‍රියාකාරකම්වලට යොමුවීමේ අවකාශය නොවූ අතර ආහාරපාන සපයා ගැනීමේ දී විවිධ දුෂ්කරතාවලට ද මුහුණ දීමට සිදු වී ඇත.

පොදුවේ ගමනාගමනය සහ වෙළදාම් කටයුතු සීමා කිරීමත් විශේෂයෙන් රෝගය පැතිරීමේ අවදානම මත මෙම ප්‍රදේශය වසා දැමීමත් නිසා වෙළඳපොලෙන් ආහාර මිල දී ගැනීමට නොහැකි වීම නිසා ඔවුන් මෙම අපහසුතාවයට පත්වූහ. එසේ ම මුදල් නොමැති කම සහ වෙළඳපළ වෙත පිවිසීමට අවස්ථාවක් නොලැබීම මෙන් ම අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය සැපයීමට ඇති වූ බාධාකාරී තත්ත්වයන් නිසා ආහාර ද්‍රව්‍ය සුලභ නොවීම මෙම තත්ත්වය වඩාත් නරක අතට පත්වීමට හේතු විය.

"මගේ මවට COVID-19 ආසාදනය වුණා. මෙහේ ඉන්නේ මමයි අම්මයි විතරයි. ලොක්ඩවුන් කළ නිසා තාත්තට මෙහෙට එන්න බැරි වුණා. අපට කෑම ගන්න විදිහක් නැති වුණා. අසල්වාසීන්ටත් මෙහෙට එන්න තහනම්. ඒ වගේම සමහරු එන්න කැමැති වුනෙත් නැහැ ඒනිසා මට කෑම බීම හොයාගන්න එක ප්‍රශ්නයක් වුණා.ඒ දවස්වල කෑම ගෙනැල්ලා දුන්නේ පොලීසියෙන් සහ හමුදාවෙන්" **-නාගරික පැල්පත්වාසී සිසුවෙක්-**

ශ්‍රී ලංකාවේ පවත්නා ග්‍රාමීය අර්ථ ක්‍රමය බොහෝවිට කෘෂිකර්මාන්තය හා බැඳී පවතී. අධ්‍යයනය සඳහා තෝරාගන්නා ලද ග්‍රාමීය තරුණ තරුණියන්ගේ පවුල් අවිධිමත් ආර්ථික ක්‍රියාවන් තුළින් තම ජීවනෝපායමාර්ග සකසා ගන්නා පිරිසක් වූහ. කෙසේවෙතත් ඔවුන්ගෙන් බොහෝදෙනෙක් යැපුම් කෘෂිකර්මය හා සම්බන්ධ වී සිටිති. මෙම නිසා අත්‍යවශ්‍යය ආහාර සම්බන්ධයෙන් ඔවුන් සාපේක්ෂ වශයෙන් වඩාත් යහපත් තත්ත්වයක පසු වන බව පෙනී යයි. ආහාර සැපයීමේ හිඟතාවයක් ඇති විය හැකි යැයි උපකල්පනය කිරීම නිසාත් තමන්ගේ ගෙවත්ත වගා කිරීමට රජයෙන් දිරිගැන්වීම් සිදුකිරීම් හා එසේම නිවැසියන්ට වඩාත් වැඩි කාලසීමාවක් නිවසේ රැඳීසිටීමට අවස්ථාව ලැබුණු නිසාත් ජනතාවගෙන් විශාල පිරිසක් ගෙවතු කෘෂිකර්මයට නැඹුරුවීමක් දක්නට ලැබේ.

මෙම තත්ත්වයන් හමුවේ යම් ප්‍රමාණයක හෝ ගෙවත්තතක් හිමි ග්‍රාමීය ජනතාව ආහාර සුරක්ෂිතතාවය සම්බන්ධයෙන් වඩාත් යහපත් තත්ත්වයක පසුවූහ.

”මේ දවස්වල පාසල් යාම සිදු නොකරන නිසා මම අයියත් එක්ක බෝග වගා කිරීමට එක් වී සිටිනවා. මිතුරන් හමුවීමට අවස්ථාව නොලැබෙන නිසා මෙමගින් මට මානසික තෘප්තියක් ලබා ගැනීමට හැකි වී තිබෙනවා ” - **ග්‍රාමීය ප්‍රජාවේ තරුණයෙක්-**

”මේ දවස්වල තාත්තාට කුලී වැඩ හමුවුණේ නැහැ. ඒ නිසා අපිට අදායමක් නැහැ. අහාර ද්‍රව්‍ය හිඟවෙයි කියලා බයකුත් තියෙනවා. ඒ නිසා අපි ගෙවත්තේ අලුතින් වගා කරනවා. හැමෝම ඒකට එකතු වෙනවා. මේ විදිහට වගා කරන එක සහ ඒ වගාව දකින එක මට සතුටක්” - **ග්‍රාමීය පාසල් සිසුවියක්-**

ආහාර සුරක්ෂිතතාවය සම්බන්ධයෙන් යම් යහපත් මට්ටමක් පැවැතියත් ආදායම් උත්පාදනය සම්බන්ධයෙන් මෙම ප්‍රජාවද ගැටලුවලට මුහුණු පා සිටින බව පෙනී ගියේ ය.

“මගේ පියාගේ රැකියාව මේසන් වැඩ කිරීමයි. මේ කාලයේදී අපේ තාත්තාට වැඩ නැහැ. මේ නිසා අපිට ආදායම් මාර්ගයක් නැහැ. අපි අතේ තියෙන ඉතාමත් සුලු මුදල ඉතා අරපරිස්සමින් වියදම් කිරීමට සිදු වී තිබෙනවා. මගේ අම්මත් සීයත් දෙන්නම ඇදුම රෝගීන්. ඔවුන්ට ප්‍රතිකාර ගත්තේ රජයේ රෝහලෙන්. නමුත් මේ දිනවල සායනයට යාමට නොහැකි නිසා පුද්ගලික ඖෂධ ශාලාවලින් බෙහෙත් ගන්න සිදුවෙලා තිබෙනවා. ඒ නිසා අපි ගොඩාක් අපහසුතාවයට පත්වෙලා තිබෙනවා. -**ග්‍රාමීය ප්‍රජාවේ තරුණයෙක්-**

අපේ පවුලේ රස්සාවක් කරන්නේ තාත්තා විතරයි. මේ මාසයේ තාත්තාට වැඩ ලැබුනේ නැහැ. ඒ නිසා අපිට ආදායමත් නැහැ. මේ දිනවල අපි අරපරිස්මින් ජීවත්වෙන හැටි ඉගෙන ගන්නවා. ඒකත් වටින දෙයක් කියල මම හිතනවා” - **ග්‍රාමීය ප්‍රජාවේ තරුණියක්-**

රැකියාවන්හි නිරතව සිටින තරුණයින් ද මෙම අවස්ථාවේ දී අපහසුතාවයන්ට පත් වී සිටින බව මෙහි දී හෙළි විය.

"මගේ රැකියාව කොණ්ඩය සැකසීමයි. මම සැලූන් එකක් වැඩ කරනවා. මෙම වසංගත තත්ත්වය නිසා අපට වැඩ නැහැ. සෞඛ්‍ය උපදෙස් අනුව සැලුන් විවෘත කරන්න බැහැ. අපි වගේ එදිනෙදා ආදායම් ලබන අයට මෙය ලොකු ප්‍රශ්නයක්. මුදල් ණයට අරන් තිබෙනවා. ඒවා ගෙවාගන්න විදිහක් නැහැ" **-LGBT ප්‍රජාවේ ප්‍රතිචාරකයෙක්-**

"මම වැඩ කරන ක්ෂේත්‍රයටත් මෙම වසංගත තත්ත්වය බලපාලා තියෙනවා. දැනට මම රැකියාව කරනවා. ඒ වුණාට මෙම තත්ත්වය දිගටම පැවතුනොත් මගේ රැකියාව අහිමිවෙලා යන්න පුළුවන්. මගේ මව වැඩ කරන්නේ ඉතාලියේ. රැකියා අහිමි වුණු විශාල පිරිසක් ලංකාවට එන්න බලාගෙන ඉන්නවා. ඒ නිසා මම ටිකක් කණස්සලෙන් පසු වෙනවා. අනාගතේ කොහොම වෙයි ද දන්නෙ නැහැ. හරිම අනියත බවක් දැනෙනවා"**-නාගරික පැල්පත්වාසී තරුණයෙක්-**

## 8. සාමාජීය බලපෑම

වසංගත තත්ත්වයන් හමුවේ සමාජීය වශයෙන් තරුණයින් කෙරෙහි සිදු වූ වැඩිම බලපෑම සිදු වූයේ ඔවුන්ගේ සංචරණය සීමා කිරීම නිසා ය. ඔවුන් එදිනෙදා නියැලුණු සමාජ ක්‍රියාකාරකම්වල නියැලීමට මෙමගින් බාධාකාරි තත්ත්වයන් ඇති විය. තම යහළුයෙහෙළියන් මුණගැසීමට ඇසුරු කිරීමට නොලැබීම මහත් අසහනයට ලක්වන කරුණක් බව ඔවුහු ප්‍රකාශ කර සිටියහ. අධ්‍යයනයට සහභාගී වු තරුණ තරුණියන් පැවැසුයේ මෙම අතිරේක කාලසීමාව ගත කිරීම සඳහා ඔවුන් රූපවාහිනිය නැරඹීම වගා කටයුතුවල නිරතවීම, අන්තර්ජාලය පරිහරණය කිරීමට යොමුවීම ආදියට වැඩි වශයෙන් නැඹුරු වූ බවයි. නොයෙකුත් සමාජ ජාලාවලට වැඩි වශයෙන් යොමුවීමත් එතුළින් ඇති වූ අන්තර්ජාලය පදනම් කරගත් හිංසා කිරීම් නොමනා ක්‍රියාවන් වැඩි වශයෙන් වාර්තා වීමත් පොදුවේ මේ සමයේ දී දැකිය හැකියි.

සමාජ මාධයන්හි නොයෙකුත් පුද්ගලයින් විසින් දක්වන ලද සමාජ විරෝධී ප්‍රකාශ තුළින් වෙනත් ප්‍රජාවන් කෙරෙහි වෛරයක් දනවන සුළු හැඟීම් සමාජය තුළ පැතිරයාම මෙම සමයේ දී දක්නට හැකිවිණි. මෙම තත්ත්වයෙන් ඇති වූ අහිතකර ප්‍රතිවිපාකයන්හි වින්දිතයින් බවට අධ්‍යයනයට ලක් වූ ප්‍රජාවගේ සමහර සාමාජිකයින් ලක් වී තිබුණු බව අනාවරණය විය.

විවිධ ජන කණ්ඩායම්වලින් සමන්විත වූ නාගරික ප්‍රජාව නියෝජනය කරන ලද තරුණයින් පවසා සිටියේ තමන්ගේ මානසික තත්ත්වය සම්බන්ධයෙන් අහිතකර බලපෑමක් මෙම ජනගහන විවිධත්වය සහ ඝනත්වය තුළින් නිර්මාණය වී ඇති බව යි. විශේෂයෙන් ම සමාජ මාධ්‍ය තුළින් COVID-19 වසංගතයේ බලපෑම සහ එහි ව්‍යාප්තිය සම්බන්ධයෙන් විවිධ වූ ජනකණ්ඩායම් වෙත චෝදනා කිරීම/වගකීම් පැවරීම පොදු මහජන මත ධාරාවේ සැඟවුණු ව්‍යාප්තියක් ලෙස පැවැති අතර එය යම් සුවිශේෂී අවස්ථාවන්හි දී ප්‍රකටව විද්‍යමාන වීමත් දක්නට ලැබිණි.

"මෙම ප්‍රදේශයේ අපි වසර ගණනවක් පුරා සාමයෙන් සහ සහෝදරත්වයෙන් යුතුව තමන් සමග ජීවත් වුණා. "මේ හැමෝම මගේ හිතවතුන් කියලයි මම සිතාගෙන සිටියේ. ඒ වුණාට අපේ පවුලට COVID-19 හැදුනම කිසි ම කෙනෙක් අපට උදව් කරන්න කැමැති වුණේ නැහැ. ඒ අයටත් COVID-19 බෝකරන්නේ අපි කියලා චෝදනා කරා -**"නාගරික ප්‍රජාවේ තරුණ සිසුවෙක්-**

අසල්වැසියන් විසින් තමන් කොන්කර ඇතැයි ද එය මහත් මානසික බලපෑමක් ඇතිකිරීමට හේතු වී ඇතැයි ද නාගරික දරිද්‍ර ප්‍රජාවේ ප්‍රතිචාරකයෝ පවසා සිටියහ. මෙම තත්ත්වයන් හමුවේ තම අධ්‍යයන කටයුතු සිදු කර ගැනීම අපහසු බවත් ඔවුහු වැඩිදුරටත් පවසා සිටියහ.

කොවිඩ් තත්ත්වයන් නිසා ඇති වූ අපහසුකාරී තත්ත්වයන් මගින් තුලනාත්මකව වැඩි බලපෑමක් නාගරික ප්‍රජාවට ඇති වී තිබේ. අධ්‍යයනයට ලක්කරන ලද ප්‍රජාවේ නිවාසවල අභ්‍යන්තර ඉඩකඩ ඉතා අවම මට්ටමක පවතී. ප්‍රජාවේ නියෝජිතයින් විසින් කරුණු දක්වන ලද ආකාරයට සමහර නිවාසවල සාමාජිකයින් විශාල සංඛ්‍යාවක් සිටීම නිසා ඔවුහු නිවසින් ලබාගන්නා මූලික අවශ්‍යතාවන් වරින් වර සපුරා ගැනීමට පුරුදු වී සිටිති. උදාහරණ වශයෙන් සියලු දෙනාට ම එකවර නිදාගැනීමට මෙම නිවාසවල පහසුකම් නොතිබීම නිසා පවුලේ සාමාජිකයින්ට වරින් වර එසේ කිරීමට සිදු වී තිබේ. එනමුත් සංචරණ සීමාකිරීම් හමුවේ සියලු සාමාජිකයින් නිවසේ රැඳීසිටීම නිසා ඔවුන්ගේ ජීවන අවකාශයන් ඉතාමත් සුලු ඉඩකඩකට සීමා වී තිබේ. එක ම නිවසක පවුල් කිහිපයක් ජීවත් වීම හා පොදු අවකාශයන්ට පිවිසීමට අවස්ථාව නොලැබීම යනාදිය මගින් ඔවුන්ගේ මානසික තත්ත්වයට දැඩි බලපෑමක් එල්ල වී ඇති බව පැහැදිලි විණි.

"අපේ ගෙදර සියලු ම දේ කිරීමට තියෙන්නේ මේ කාමරේ විතරයි. දැන් කාටවත් එළියට යන්න බැරි නිසා පවුලේ හැමදෙනා ම ගෙදර සිටිනවා. එතකොට අපට පාඩම් කරන්න අමාරුයි. ගෙදර කරන්න වෙන වැඩක් නැති නිසා හැමෝම රූපවාහිනිය බලනවා. එතකොට අපිටත් බලන්න හිතෙනවා"- **නාගරික පැල්පත්වාසී සිසුවියක්-**

අධ්‍යාපනයට සුදුසු නිස්කලංක පරිසරයක් නිවසේ නොමැතිවීම නිසා බොහෝ අවස්ථාවන්හි දී තමන් අධ්‍යයන කටයුතුවල නිරතවන්නේ පාසලේ දී සහ පුස්තකාල වැනි පොදු අවකාශයන්හි බවත් අතිරේක උපකාරක පන්තිවලට සහභාගීවීමට අවස්ථාව නොමැතිවීම තුළින් තම අධ්‍යාපන අවස්ථා සහ ඉගෙනීම් කෙරෙහි මෙම වසංගත තත්ත්වය දැඩි බලපෑමක් සිදු වී තිබෙන බව ඔවුහු ප්‍රකාශ කළහ.

"මෙම නිවස ඉතා කුඩා නිසා මම පාසලෙන් දෙන පැවරුම් කරන්නේ පාසලේ දී හෝ අපේ ගේ ළඟ තිබෙන ප්‍රජා මධ්‍යස්ථායේ දී ය. එහෙම නැත්නම් මම පුස්තකාලයට යනවා. ඒ වුනාට මේ ස්ථාන වහලා නිසා ඒවට යන්න බැරි වුනා. පාඩම් කරන්න තරම් සුදුසු මානසික වාතාවරණයක් නැහැ. ඒ නිසා විභාගේ හරියට කරන්න පුළුවන් වෙයි ද කියලා සැකයක් තියෙනවා" **-නාගරික පැල්පත්වාසී තරුණ පාසල් සිසුවෙක්-**

මෙයට ප්‍රතිවිරුද්ධ වශයෙන් ග්‍රාමීය ප්‍රජාව නියෝජනය කළ තරුණයින් සාපේක්ෂ වශයෙන් වැඩි නිදහස් අවකාශයකට හිමිකම් කියන ලදී.

"පාසල් ගුරුවරුන් සමාජ මාධ්‍ය ජාල හරහා අපිව සම්බන්ධ කරගන්නවා. අපිට මෙම පාඩම් කරන්න මගේ දෙමව්පියන් උනන්දු කරනවා. මම හිතන්නේ මේ වතාවේ අපි වැඩියෙන් අධ්‍යයන කටයුතු සිදු කළා. ඒකට අවශ්‍ය පරිසරය අපට තියෙනවා. ප්‍රශ්නේ තියෙන්නේ හැමදේම තනියෙන් කිරීමට සිදු වීමයි" **- ග්‍රාමීය ප්‍රජාවේ සිසුවෙක්-**

විශේෂයෙන් ඔවුන්ගේ පවුලේ මූලික ආර්ථික ක්‍රියාකාරකම් එනම් කෘෂිකාර්මක කටයුතු සමග සම්බන්ධවීමට ඔවුන්ට අවස්ථාව ලැබුණු හෙයින් එදිනෙදා ජීවිතයේ දී ඇති වන මානසික පීඩාව අවම මට්ටමක පවතින බව නිරීක්ෂණය කළ හැකි විය. මෙම නිසා අධ්‍යාපනික කටයුතු විධිමත් ආකාරයෙන් සිදු කිරීමට අවශ්‍ය පෙළඹවීම සහ එම පද්ධතිය ක්‍රියාත්මක නොවීම නිසා ඇතිවන බලපෑම හැරුණු විට අධ්‍යයන කටයුතු අඩාල වීම සඳහා තුඩු දෙන සමාජීය ගැටලුවලට ඔවුන් නිරාවරණයවීම අවම මට්ටම පැවැතිණි.

## 9. මානසික බලපෑම සහ ඒවා අවම කිරීමට ඔවුන් විසින් උපයෝගී කරගන්නා ක්‍රියාමාර්ග

නාගරික පැල්පත්වාසී ප්‍රජාවට දීර්ඝ කාලයක් පුරා නිරෝධායනයට ලක්වීම හෝ ආයතනගතව ප්‍රතිකාර ලබාගැනීමට සිදුවිණි. මෙම නිසා ඇත්ත වශයෙන් ම ඔවුන්ට ඇති වූ මානසික පීඩාකාරී තත්ත්වයන් සමනය කරගැනීමට ලද අවස්ථා ගණන සීමාසහිත විය. නිරෝධායන මධ්‍යස්ථානවලට යොමුකරන ලද ළමුන්ට චිත්‍ර ඇඳීමට සහ රූපවාහිනිය නැරඹීමට පහසුකම් සලස්වා දුන් බව ඔවුහු පැවසූහ.

බොහෝ දෙනෙකු රූපවාහිනිය නැරඹූ බව සඳහන් කළ අතර සමහර තරුණයින් සමාජමාධ්‍ය ජාලාවලට වැඩි වශයෙන් සම්බන්ධවීම තම මානසික ආතතිය සමනය කරගැනීම සඳහා උපයෝගී කරගෙන තිබිණි.

ග්‍රාමීය අංශයේ තරුණයින් එතරම් දිගු කාලසීමාවක් වසා දමන ලද තත්ත්වය යටතේ ගත කිරීමට සිදු නොවුනු අතර කෘෂිකර්ම කටයුතු සඳහා ඉඩකඩ ලබා දී තිබුණු හෙයින් එම කටයුතුවල නිරත වූහ. විශේෂයෙන් ම පාසල් වයස් කාණ්ඩයේ ප්‍රතිචාරකයෝ තමන් අධ්‍යාපන කටයුතුවල නිරත වීමෙන් මෙම ආතතිකාරී තත්ත්වය සමනය කරගත් බව පැවසූහ.

"මගේ යහලුවන් හමුවීමට නොහැකිවීම මට තියෙන ලොකු ප්‍රශ්නයක්. අපි වෙනදා සෙල්ලම් කරන්න ඇවිදින්න යන්න පුරුදුවෙලා හිටියා. දැන් ඒවා සීමා වෙලා. මානසික පීඩාවක් දැනුන වෙලාවට මම කරන්නේ අපේ වත්තේ ඇවිදින්න යන එක. එයින් එතරම් වැඩක් නොවුනත් වෙන කරන්න දෙයක් නැහැ" **-ග්‍රාමීය ප්‍රජාවේ තරුණියක්-**

"අනාගතයේ මගේ රැකියාව නැතිවෙයි කියල මට හිතෙනවා. එහෙම වුනොත් මම මොනවාද කරන්නෙ කියලා මම සැළසුම් කරනවා. හිතට පීඩාවක් දැණුනම මම ආගමික කටයුතුවල නිරත වෙනවා" **- නාගරික ප්‍රජාවේ තරුණයෙක්-**

මෙහි දී සඳහන් කළ යුතු වැදගත් කරුණ වන්නේ ඔවුන්ගෙන් කිසිවෙක් හානිකර ප්‍රතිඵල ගෙන දෙන ආතති කළමනාකරණ උපක්‍රම භාවිත කිරීමට යොමු නොවීමයි.

## 10. අධ්‍යාපනයට සිදු වී තිබෙන බලපෑම

COVID-19 වසංගත තත්ත්වයන් හමුවේ පැවති අවදානම හේතුවෙන් නිරෝධායන ඇඳිරිනීතිය පැනවීමට රජය විසින් තීරණය කරනු ලැබුවේ මාර්තු මස තෙවැනි සතියේ දී ය. බලධාරීන් විසින් සැලසුම් සහගතව කාර්යක්ෂම ආකාරයෙන් ක්‍රියාත්මක කරන ලද වැඩපිළිවෙල නිසා ක්‍රමක්‍රමයෙන් රටේ තත්ත්වයන් වඩාත් යහපත් තත්ත්වයට පත් වූ අතර ජූනි මස මුල්භාගයේ දී රට නැවතත් සම්පූර්ණයෙන් විවෘත කිරීමට හැකි විය. ඒ අනුව රටේ සමාජීය සහ ආර්ථික කටයුතු ජූලි මස මුල්භාගය වන විට නව සාමාන්‍ය තත්ත්වයට පත් විය. කෙසේ වෙතත් ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය සම්බන්ධයෙන් මෙම සුබවාදී තත්ත්වයන් අත්පත් කරගැනීමට තවමත් සමත් වී නොමැත. නමුත් ශ්‍රී ලංකාවේ සියලු ම පාසල් පන්ති සහ කාණ්ඩ වශයෙන් ක්‍රමක්‍රමයෙන් නැවත විවෘත කිරීමට බලධාරීන් තීරණය කර තිබේ. විශ්වවිද්‍යාල සහ අනෙකුත් අධ්‍යාපන ආයතන සිසුන්ට විවෘත වෙමින් පවතී. පෞද්ගලික උපකාරක පන්ති නැවත ආරම්භ වී ඇති අතර වෙනත් පෞද්ගලික අධ්‍යාපන ආයතන ද නැවත අධ්‍යාපන කටයුතු ආරම්භ කර තිබේ. එනමුදු මෙම පද්ධතිය පරිපූර්ණ වශයෙන් ක්‍රියාත්මක වීමට තව සැලකිය යුතු කාල සීමාවක් ගතවනු ඇත. මෙම COVID-19 වසංගත තත්ත්වය හමුවේ වැඩිම බලපෑමක් සිදු වී තිබෙන්නේ අධ්‍යාපනය ක්ෂේත්‍රයට බව පැහැදිලිව පෙනී යන අතර එනමුත් එමගින් සිදු වී ඇති බලපෑමේ ප්‍රමාණය තක්සේරු කිරීම ඉතා අසීරු කරුණක් බව මෙහි දී සඳහන් කළ යුතු ය.

COVID-19 වසංගතය හේතුවෙන් තරුණයින්ගේ අධ්‍යාපනයට සිදු වී ඇති බලපෑම හඳුනාගැනීම සඳහා සිදු කරන ලද මෙම අධ්‍යයනයේ දී පාසල් ළමුන්, විශ්වවිද්‍යාල සිසුන් සහ තෘතීයික අධ්‍යාපනය ලබන සිසුන්ගෙන් අදහස් ලබාගෙන තිබේ.

COVID-19 වසංගත තත්ත්වය ව්‍යාප්ත වීමේ අවදානම මත රජය විසින් පාසල් සහ අනෙකුත් සියලු ම අධ්‍යාපන ආයතන වසා දැමීමට තීරණය කිරීමට සමගාමීව අධ්‍යාපන අමාත්‍යාංශයේ මැදිහත්වීම මත ජාතික රූපවාහිනියේ එක් නාලිකාවක් අධ්‍යාපන වැඩසටහන් විකාශය කිරීම සඳහා ම වෙන් කරනු ලැබිණි. සමස්තයක් වශයෙන් රටේ ජනතාව අන්තර්ජාලයට ප්‍රවේශ වීම සහ සහ රූපවාහිනිය නැරඹීම පිළිබඳව සිදුකරන ලද තක්සේරුවකින් පසුව වැඩි පිරිසකට තම නිවසේ රූපවාහිනියක් තිබීමත් එය නැරඹීමට අවශ්‍ය පහසුකම් තිබීමත් යන පදනම මත අධ්‍යාපන වැඩසටහන් රූපවාහිනියෙන් විකාශය කිරීම ආරම්භ කරන ලදී. සිංහල සහ දෙමළ භාෂාවන් දෙකෙන් ම නිශ්චිත කාලසටහනකට අනුව විකාශය කරන ලද මෙම වැඩසටහන් පිළිබඳව අපගේ ප්‍රතිචාරකයින්ගෙන් විමසීමේ දී අනාවරණය වූයේ ඔවුන්ගෙන් වැඩි පිරිසක් මෙම වැඩසටහන පිළිබඳව දැනුම්වත්ව නොසිටි අතර ඒවා නැරඹීමට යොමුනොවූ බවත් ය. අධ්‍යාපනික වැඩසටහන් නැරඹූ බවට ප්‍රකාශ කරන ලද ස්වල්පදෙනාගේ අදහස් වූයේ මෙම කාලසටහන් පිළිබඳව ප්‍රමාණවත් දැනුම්දීමක් සිදු නොවූ බව ය. නිවසක තිබෙන්නේ එක ම රූපවාහිනියක් බවත් නිවසේ සාමාජිකයින් සියලු දෙනා පාහේ රූපවාහිනිය නැරඹීමට යොමු වී ඇති මෙම අවස්ථාවේ අධ්‍යාපන වැඩසටහන්වලට සහභාගීවීම දුෂ්කරබව නාගරික ප්‍රජාව නියෝජනය කළ තරුණියන් විසින් පවසා සිටින ලදී.

මෙම රූපවාහිනී නාලිකා අධ්‍යාපන වැඩසටහන්වලට සම්බන්ධ වූ සුලු පිරිස පැවසූයේ වැඩිදුර තොරතුරු ලබාගැනීමට නොහැකි වීම අපැහැදිලි පාඩම් නැවත පැහැදිලි කරගැනීමට අවස්ථාව නොමැති වීම මෙම විකල්ප අධ්‍යාපන ක්‍රමයේ මූලික දුර්වලතා බව ය. සමස්තයක් වශයෙන් මෙම මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබීමට ඔවුන් තුළ එතරම් නැඹුරුවක් නොමැති බව පැහැදිලිව පෙනී ගිය කරුණක් විය.

සමාජ මාධ්‍යජාලා ඔස්සේ අධ්‍යාපනය ලබා දීම වඩාත් ප්‍රචලිතවීමත් මෙම සමයේ දී දක්නට ලැබිණි. මූලික වශයෙන් අවිධිමත් ආකාරයට ආරම්භ වූ මෙම විකල්ප අධ්‍යාපන ක්‍රමය පසුව වඩාත් විධිමත් ආකාරයට සැලසුම් කිරීමට බලධාරීන් විසින් අවධානය යොමු කිරීම දැකගත හැකි විය. පෞද්ගලික උපකාරක පන්ති පැවැත්වීමට නොහැකි වීමත් සමගම පෞද්ගලික පන්ති පවත්වනු ලබන ගුරුවරුන් විසින් තම සිසුන් සම්බන්ධ කරගැනීම සඳහා සමාජ මාධ්‍ය ජාලා යොදාගැනීම දක්නට හැකි විය. මෙය පසුව සමහර රජයේ පාසල් විසින් ද ක්‍රියාවට නංවන ලද අතර ඉන් පසුව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සපයන ලද පහසුකම් උපයෝගී කරගෙන වඩාත් විධිමත් ආකාරයට මෙම විකල්ප අධ්‍යාපන වේදිකාවන් සැකසෙමින් පවතී. කෙසේ වෙතත් මෙම පහසුකම් අදාළ පාසල් විසින් කොතරම් දුරට භාවිතයට ගනු ලබන්නේ ද සහ ඒ සඳහා අවශ්‍ය පහසුකම් ඔවුන් සතුව තිබේ ද යන්න බරපතල ගැටලුවක්ව පවතී. එබැවින් අපගේ පාසල් පද්ධතිය තුළ පැහැදිලිව විද්‍යමාන වන අසමමිතික තත්ත්වයන් පවතින වාතාවරණයක් තුළ එම සුවිශේෂී සීමාකාරී තත්ත්වයන් කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමුකිරීමෙන් තොරව ලබාදෙන සාර්ව විසඳුම් මෙම තත්ත්වයට කොතරම් දුරට පිළිතුරක් සපයන්නේ ද යන්න දැඩි විමසිල්ලට ලක් කළ යුතු ය.

ග්‍රාමීය ප්‍රජාව නියෝජනය කරන ලද සිසුන් හැරුණු කොට අනෙකුත් ප්‍රතිචාරකයින් තමන්ගේ අධ්‍යයන කටයුතු වට්ස් ඇප්, වයිබර් වැනි සමාජ මාධ්‍යජාලා ඔස්සේ යම්තාක් දුරකට සිදු කරන බව පෙනී ගියේය. මෙහි දී බොහෝ අවස්ථාවන්හි දී සිදුවන්නේ ගුරුවරුන් විසින් තමන්ගේ සිසුන් කණ්ඩායම් වෙනුවෙන් පාඩම් සකස් කර ඒවා සිසුන්ගේ සමාජමාධ්‍ය ගිණුම් වෙත යොමු කිරීමයි. මෙම අධ්‍යයනයට සහභාගී වූ සිසුන් විසින් දක්වන ලද අදහස්වලට අනුව විධිමත් අධ්‍යාපනය සිදු කළ නොහැකි, මෙවැනි වාතාවරණයක දී මෙම විකල්ප අධ්‍යාපන ක්‍රමය ඔවුන් විසින් ඇගයීමට ලක්කරන බව හෙළිවිය. හුදු දේශන ආකාරයට ක්‍රියාත්මක වන මෙම අධ්‍යාපනයේ දී සිසුන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳ තක්සේරුව සහ ඔවුන්ගේ සාධන මට්ටම් පිළිබඳව නිශ්චිත නිගමනවලට එළැඹීම දුෂ්කර වේ.

“අපට මේ දවස්වල කිරීමට නියමිත පාඩම් අපගේ ගුරුවරිය එවනවා. ඊට අමතරව අපිට ප්‍රශ්න පත්‍ර එවනවා. අපි ඒවට පිළිතුරු ලියනවා. පාසල් පටන් ගත්තට පස්සේ මේ ප්‍රශ්න සාකච්ඡා කරනවා කියලා අපිට දැනුම් දුන්නා” **-ග්‍රාමීය පාසල් සිසුවෙක්-**

අන්තර්ජාලය පදනම් කරගත් මෙම අධ්‍යාපනයට ප්‍රවේශ වීමට පවත්නා ප්‍රධාන බාධාවන් ලෙස මෙහි දී අනාවරණය වූයේ ඒ සඳහා අවශ්‍ය පහසුකම් නොමැති වීමයි. සමාජ මාධ්‍ය ජාලාවලට පිවිසීමට අවශ්‍ය පහසුකම්වලින් යුත් දුරකතන නොමැති වීම, අන්තර්ජාලයට සම්බන්ධවීමේ දී සිදු කළ යුතු ගෙවීම් සඳහා මුදල් නොමැති වීම, අන්තර්ජාල සම්බන්ධතාවන්හි පවත්නා දුර්වල තත්ත්වයන් යනාදිය මෙහිදී කැපීපෙනේ. මෙයට අමතරව ශ්‍රී ලංකාවේ පාසල් ළමුන්ට ජංගම

දුරකතන භාවිත කිරීමට පාසල්වලින් අවසර ලබානොදේ. ළමුන් බොහොමයක් අවස්ථාවන්හි දී භාවිතා කරන්නේ තමන්ගේ දෙමාපියන්ගේ ජංගම දුරකතනයන්ය. නමුත් ඔවුන් නිවසේ රැඳී නොසිටින අවස්ථාවන්හිදී මේ පහසුකම ඔවුන්ට ලබා ගැනීමට නොහැකි වේ.

"අපේ ගෙදර කාටවත් ස්මාර්ට් ජංගම දුරකථනයක් නැහැ. ඒ නිසා මට මේ පන්තිවලට සහභාගී වෙන්න ලැබුනෙ නැහැ. ඉතින් මම මගේ අසල්වැසි ගෙදරක අක්කා කෙනෙක්ගේ දුරකථනයකින් මේවාට සම්බන්ධ වුණා. නමුත් හැමදාම මෙහෙමෙ කරන්න අමාරුයි"- **ග්‍රාමීය පාසල් සිසුවියක්-**

"මට ස්මාර්ට් දුරකථනයක් හොයාගන්න විදිහක් නැහැ ඒනිසා මට මේ පාඩම්වලට සම්බන්ධ වෙන්න පුලුවන් කමක් නැහැ. ඒ නිසා මම යහලුවන්ට කියල අපේ ටීචර් එවන පාඩම්වල ප්‍රින්ට් අවුට් ගන්නවා" - **ග්‍රාමීය ප්‍රජාවේ සිසුවියන් දෙදෙනෙක්**

"මට ස්මාර්ට් ජංගම දුරකථනයක් නැහැ. නමුත් අපේ පාසලේ පාඩම් අන්තර්ජාලයෙන් පවත්වනවා. මම මේ වසරේ අ.පො.ස සා/පෙ විභාගයට පෙනී සිටිනවා. ඒ නිසා මට දුරකථනයක් අරන් දෙන්න අපේ තාත්තා තීරණය කරා. නමුත් එයාට මුදල් නැහැ. ඒ නිසා අපිට රජයෙන් ලැබුණු සහනාධාර සහ අසැල්වැසියෙන්ගෙන් ණයක් අරගෙන මිල දී ගන්නයි අපි තීරණය කළේ" **-ග්‍රාමීය ප්‍රජාවේ තරුණයෙක්-**

දුරස්ථ අධ්‍යාපනය ලබාදීමේ දී ඒ සඳහා ගුරුවරුන්ගේ කුසලතා නංවාලීම සඳහා ඔවුන් පුහුණු කිරීමේ වැඩපිළිවෙළක් සැකසීමේ දැඩි අවශ්‍යතාවක් පවතී. මෙවැනි තත්ත්වයක දී භාවිත කළ හැකි අධ්‍යාපන ආධාරක නිර්මාණය කිරීමට ද අවධානය යොමු කළ යුතුය. දුරස්ථ අධ්‍යාපනය ලබාදීමේ දී උපයෝගී කරගත හැකි විශේෂ විධික්‍රම මෙවලම් පිළිබඳව මෙහි දී අවධානය යෙමු කළ යුතු අතර ඒ සඳහා ප්‍රවීණයින්ගේ උපදෙස් ලබාගත යුතු වේ.

අපට මේ අවුරුද්දේ ඉස්කෝලේ යන්න හමුවුනේ දවස් කිහිපයක් විතරයි. ඒ නිසා දැන් ඔක්කොම පාඩම් කරන්නේ ඔන්ලයින් විදිහට. හැම ගුරුවරුයෙක්ම පාඩම් දානවා. එතකොට ඒ ඔක්කොම පාඩම් කරන්න අමාරුයි. වැඩ ගොඩාක් දෙනවා. සමහර දේවල් අපිට තේරුම් ගන්න අමාරුයි. ඉක්මනට දේවල් උගන්නගෙන ගියාට අපිට ඒවා තේරුම් ගන්න අමාරුයි. ඒක නවත්වනවා නම් හොඳයි" **-නාගරික පැල්පත්වාසී ප්‍රජාවේ සිසුවියක්**

විශේෂයෙන් මෙම වසරේ දී පැවැත්වෙන රජයේ විභාගවලට පෙනී සිටින සිසුන් සඳහා අන්තර්ජාලය පදනම් කරගෙන ඉගැන්වීම් සිදුකරන මෙන් ගුරුවරුන්ට දැනුම්දීම මත අදාළ විෂයමාලාව ආවරණය කිරීමට ගුරුවරු ප්‍රයත්න දරති. අධික පැවරුම් ප්‍රමාණයක් ළමුන් වෙත යොමුකිරීම මගින් ඔවුනට මානසික පීඩාවක් ඇති වී තිබෙන බව මෙහි දී අනාවරණය විය.

කෙසේ වෙතත් විශ්වවිද්‍යාල සිසුවියක් අප සමග පැවසුවේ අන්තර්ජාලය පදනම් කරගත් අධ්‍යාපනය ලබාදීම ඉතා සාර්ථකව සිදු වන බවයි. අපගේ දේශන සියල්ලක් ම දැන් ඔන්ලයින් ආකාරයට සිදු කරනවා. අපට අවශ්‍ය ජංගම දුරකථනය සහ ඒ සඳහා අන්තර්ජාලට පිවිසීමේ දී අවශ්‍ය පහසුකම් නොමිලයේ ලබාදීමට විශ්වවිද්‍යාලය කටයුතු කර තිබෙනවා. මේ ක්‍රමය හොඳයි; එකම දේ මේ තාක්ෂණය නිවැරදිව භාවිත කරන්නේ කොහොමද කියල අපේ

ළමයින්ට කියලා දෙන්න ඕනෑ. එහෙම නැත්නම් ළමයි මේ තාක්ෂණය හරියට කියල දෙන්න ඕනෑ. එහෙම නැතිවම ඒ අය අනවශ්‍ය ප්‍රශ්නවලට මුහුණ දෙනවා. එහෙම තත්ත්වයන්ට මුහුණ දුන්න ළමුන් මම දන්නවා" **-නාගරික ප්‍රජාවේ විශ්වවිද්‍යාල සිසුවියක්-**

අධ්‍යාපනය සහ ඉගෙනුම යන්නට ප්‍රධාන වශයෙන් දෙපාර්ශවයක් සම්බන්ධ වේ. ඒ අධ්‍යාපනය ලබාදෙන්න සහ ඉගෙනුම ලබන්නා යන දෙදෙනායි. විශේෂයෙන් පාසල් අධ්‍යාපනය සාර්ථක වීමට අවශ්‍ය මෙහෙයවීම සහ මගපෙන්වීම සිදු කිරීමට ගුරුවරුන් වැදගත් කාර්යයභාරයක් ඉටු කරනු ලබයි. මේ අනුව අන්තර්ජාලය පදනම් කරගත් අධ්‍යාපනය ලබා දීම සම්බන්ධයෙන් ගුරුවරුන් තුළ පවත්නා දැනුවම්වත්භාවය මෙහි දී තීරණාත්මක සාධකයක් වේ.

දුරස්ථ අධ්‍යාපනයට සම්බන්ධ වී සිටි ළමුන්ගේ අදහස්වලට අනුව මෙම අධ්‍යාපනය ලබා දීම සම්බන්ධයෙන් ගුරුවරුන්ගේ දැනුම සහ කුසලතා පොදුවේ අවම මට්ටමක පවතී. මෙම මෘදුකාංගවල අඩංගු පහසුකම් භාවිත කිරීමට එනම් සිසුන් සමග සංවාද පැවැත්වීමට ඔවුන්ට පැවරුම් ලබා දීමටත් ඒවා ඇගයීමටත් මෙම ඉගැන්වීම් පාඩම්වල දී ප්‍රමාණවත්ව සිදු නොවේ.

සමහර අවස්ථාවන්හි දී ගුරුවරුන් මෙම ඉගැන්වීමේ කටයුතු සඳහා තමන්ගේ තාක්ෂණික සහයෝගය ඉල්ලාසිටි බව ඔවුහු පැවසූහ.

අධ්‍යයනයේ දී අදහස් දැක් වූ ආබාධිත ප්‍රජාව නියෝජනය කළ තරුණයින් පැවසූයේ පවත්නා තත්ත්වය මත තම විශේෂ අධ්‍යාපන ආයතන වසා දැමීම මගින් තමුන් සම්පූර්ණයෙන් අධ්‍යාපනික කටයුතුවලින් බැහැරව සිටීමට හේතු වී ඇති බවයි. අනෙකුත් සාමාන්‍ය සිසුන්ගේ අධ්‍යාපන අවස්ථා තහවුරු කිරීම සඳහා රජය මගින් විවිධ ක්‍රියාමාර්ග හඳුන්වාදෙනු ලැබුවත් මෙම ප්‍රජාව සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවධානයක් යොමු නොවී ඇති බව ඔවුහු පැවසූහ.

පාසල් දිර්ඝ කාලයක් පුරා වසා තැබීම මගින් අධ්‍යාපනය සම්බන්ධයෙන් අහිතකර බලපෑම් ඇති වන බව පැහැදිලි කරුණකි. මෙමගින් අඛණ්ඩව පාසල් යාමේ වැදගත්කම අධ්‍යාපනය ලබාගැනීමේ දී අන්තර්ක්‍රියාකාරිත්වයේ වැදගත්කම පිළිබඳව හැඟීම ගිලිහීයාම සිදු වේ. අධ්‍යයනයේ දී ලබාගත් තොරතුරු අනුව ප්‍රතිචාරකයින්ගෙන් දෙදෙනෙක් මින් පසුව පාසල් යාමෙන් ඉවත්වීමට අපේක්ෂා කරන බවට අදහස් පළ කළහ. මෙම දෙදෙනාම පිරිමි ළමුන් වන අතර ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ වර්තමාන ප්‍රවණතාවන් අනුව පිරිමි ළමුන් අධ්‍යාපනයෙන් ගිලිහී යාමේ වැඩි ප්‍රවණතාවක් දක්නට ලැබේ. මෙම තත්ත්වයන් තවත් උද්දීපනය කිරීමට පවත්නා වාතාවරණය හේතු වී ඇති බව පෙනී යයි.

එමෙන් ම ඇතැම් පාසල්වල ගුරුවරුන් අන්තර්ජාලය හෝ සමාජමාධ්‍ය ඔස්සේ ඉගැන්වීම් කටයුතු සිදු කිරීමේ දී දක්ෂ සිසුන්ට වැඩි අවධානයක් යොමුකිරීම හේතුවෙන් ඇතැම් ළමයි එවැනි ඔන්ලයින් පන්තිවලට සහභාගීවීමට මැලිබවක් දක්වන බව අධ්‍යයනයේ දී අනාවරණය විය.

"මම වැඩිය ඔන්ලයින් ක්ලාස්වලට යන්න ආස නැහැ. ටීචර් උගන්වන්නේ දක්ෂ ළමයින්ට විතරයි" **-ග්‍රාමීය ප්‍රජාවේ සිසුවියක්-**

## නිර්දේශ

- දීර්ඝ කාලසීමාවක් පුරා පාසල් වසාතැබීමේ ප්‍රතිඵලයක් වශයෙන් අදාළ කාලසීමාවට අයත් විෂයමාලාව සම්පූර්ණ කිරීමට ප්‍රමාණවත් කාලසීමාවක් නොපවතී. මෙම තත්ත්වය මත ගුරුවරුන් විසින් අන්තර්ජාලය ඔස්සේ ඉගැන්වීමේ කටයුතු වේගයෙන් කරගෙන යමින් විෂයමාලාව ආවරණය කිරීමට උත්සාහ දරනු නිරීක්ෂණය කළ හැකි විය. වැඩිදුර පැහැදිලි කිරීම් සහ ඇගයීම් නිසි ආකාරයෙන් සිදු නොවන මෙම වාතාවරණය තුළ ශීඝ්‍රගාමී ඉගැන්වීම තුළින් ළමුන්ට විෂයය කරුණු ග්‍රහණය කරගැනීමට අවබෝධ කර ගැනීමට ප්‍රමාණවත් කාලසීමාවන් නොලැබේ. සිසුන් වෙත අධික ලෙස පැවරුම් ලබා දීම මගින් ඔවුන් පීඩාවට පත්වේ. විවිධ ධාරිතා මට්ටම් හා කුසලතාවන්හි වෙනස්කම්වලින් යුත් සිසුන් මෙමගින් අපහසුතාවයට පත්වී තිබෙන බව නිරීක්ෂණය කළ හැකි විය. සිසුන්ට තම අධ්‍යයන කටයුතුවල නිරතවීම සඳහා ප්‍රමාණවත් කාලසීමාවක් ලබා දිය යුතු අතර අන්තර්ජාලය පදනම් කරගෙන සිදු කරනු ලබන ඉගැන්වීමේ දී ඔවුන්ට දැරිය හැකි මට්ටම් පවත්වා ගැනීමට සැලකිලිමත් විය යුතු ය.

- පාසල් අධ්‍යාපන කටයුතුවල ප්‍රමාණවත් අයුරින් නියැලීමට අවස්ථාව නොලද බැවින් විශේෂයෙන් ම මෙවර ජාතික විභාගවලට පෙනී සිටින සිසුන් තුළ යම් මානසික ආතතියක් පැනනැගී ඇති බව නිරීක්ෂණය කළ හැකි විය. මෙවැනි වාතාවරණයක දී පාසල් විවෘත කිරීම සහ විභාග පැවැත්වීම සිදු කළ යුත්තේ ගුරුවරුන්ගෙන් සහ සිසුන්ගෙන් අදහස් විමසීමෙන් පසුව ය.

- අන්තර්ජාලය ඔස්සේ අධ්‍යාපන කටයුතු පවත්වාගෙන යාමේ විකල්ප අවස්ථාව ප්‍රවර්ධනය කිරීමට ක්‍රියාකිරීම සම්බන්ධයෙන් අධ්‍යාපන බලධාරීන් අගය කිරීමට ලක්විය යුතු ය. අධ්‍යාපනය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා දරන ලද මෙම ක්‍රියාමාර්ගය සිසුන් විසින් අගය කළ අතර එහි තවදුරටත් දියුණු කළ යුතු අංශ ගණනාවක් පවතී. මේවා අතර අදාළ යටිතල පහසුකම් සැකසීම, අවශ්‍ය මෘදුකාංග සහ අන්තර්ජාල පිවිසුම් අවස්ථා සියලු ම පාසල් සිසුන් අන්තර්කරණය වන අයුරින් සම සාධාරණත්වයෙන් යුතුව නොමිලයේ ලබා දීම ඉතා වැදගත් වේ. සම්පත් බෙදීයාමේ විෂමතාවය අතිශයින් පැහැදිලිව දෘශ්‍යමාන වන අධ්‍යාපන ක්ෂේත්‍රයේ සියලුදෙනා අන්තර්කරණය වූ ගුණාත්මක අවස්ථාවන් තහවුරු කිරීමට මෙම සාධක පිළිබඳව අවධානය යොමු කිරීම ඉතා වැදගත් වේ.

- පාසල් සිසුන්ට ජංගම දුරකථන භාවිත කිරීම සීමාකර තිබෙන අවස්ථාවක පාසල විසින් ම ඔවුන්ට ජංගම දුරකථන ඔස්සේ අධ්‍යාපනයට පිවිසෙන ලෙසට ඉල්ලීම් කිරීම දකගත හැකි ය. මෙම නව සාමාන්‍ය තත්ත්වයන් ලෙස සැලකිය හැකි වුවත් අදාළ නව සාමාන්‍ය තත්ත්වයේ දී කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව, අන්තර්ජාලය පරිශීලනයේ දී පිළිපැදිය යුතු ආරක්ෂක උපායමාර්ග සහ ආචාරධර්ම පිළිබඳව දැනුම්වත් කිරීමට විධිමත් වැඩපිළිවෙළක් සැකසිය යුතුය.

- එදිනෙදා සාමාන්‍ය ජීවන රටාවට සිදු වූ බලපෑම නිසා මිතුරු මිතුරියන් ඇසුරු කිරීමට නොහැකිවීම ක්‍රීඩා කිරීමට නොහැකිවීම ඒකියා අහිමිවීම අනාගතය පිළිබඳව අවිනිශ්චිතතාවයක් පැවැතීම පොදු අවකාශයන් භාවිත කිරීමට නොහැකිවීම සහ විශේෂයෙන් නාගරික පැල්පත්වාසී අධි ජනගනත්වයෙන් යුත් ව්‍යාකූල සමාජ පරිසරය හමුවේ තරුණයින් මුහුණදෙන මානසික පීඩාකාරී තත්ත්වයන් ගෙන් ඇතිවන්නා වූ ආතතිකාරී තත්ත්වයන්ට ලක්වුණු ප්‍රජාවගේ මානසික සෞඛ්‍ය තත්ත්වයන් නංවාලීම සඳහා බලධාරීන් විසින් අවශ්‍ය පියවර ගත යුතු වේ.

- ඇති වූ හදිසි තත්ත්වයන් මත නිසි මගපෙන්වීමක් සහ විධිමත් ක්‍රියාමාර්යක් නොපැවති සමයක දී වුව ද අඛණ්ඩ අධ්‍යාපනයක් ලබාදීමට ගුරුවරුන් විසින් දක්වන ලද උනන්දුව සහ ඒ සඳහා යොදාගත් උපක්‍රම අගය කළ යුතු වේ. කෙසේවෙතත් ඉගැන්වීමේ සාම්ප්‍රදායික ක්‍රමවලට හුරු වී සිටින ගුරුවරුන්ට මෙම නව තාක්ෂණය පදනම් කරගත් අධ්‍යාපන ක්‍රමවලට හුරුවීම අපහසුකාරී අත්දැකීමක් බවට පත්විණි. දුරස්ථ අධ්‍යාපනය ක්‍රමය තොරතුරු තාක්ෂණය පිළිබඳව ගුරුවරුන්ගේ දැනුම හා කුසලතා වර්ධනය කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් ආරම්භ කළ යුතු වේ.

- පාසල් ළමුන්ගේ අධ්‍යාපනය මෙන් ම ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩසටහන් ද මෙම කාලසීමාව තුළ නිසි අන්දමින් ක්‍රියාවට නැංවීමට නොහැකි විය. මෙම තත්ත්වය ද අධ්‍යාපනයේ සංවර්ධනය ප්‍රගමනය වෙන්වෙන් බලපෑමක් සිදු කරනු ඇත. එබැවින් දුරස්ථ මාර්ගිකව ගුරුවරුන් පුහුණු කිරීමේ විකල්ප වැඩසටහන් පිළිබඳව ද අවධානය යොමු කළ යුතු වේ.

- ජාතික වශයෙන් නොවූවත් පළාත් සහ ප්‍රාදේශිය මට්ටමින් මෙම තත්ත්වයට විකල්ප විසඳුම් සොයාගැනීමට ගන්නා ලද උත්සාහයන් හමුවේ නව නිර්මාණ, සාර්ථක නව අත්දැකීම් නවෝත්පාදනයක් ජනිත කරගැනීමට හැකි වී තිබේ. අධ්‍යාපන බලධාරීන් මෙම නව සොයාගැනීම් පිළිබඳව අවධානය යොමුකර ඒවා ජාතික තලයේ යොදා ගැනීමට ඇති හැකියාව පිළිබඳ අවධානය යොමු කළ යුතු වේ.

- මෙම වසංගත තත්ත්වයන් තුළ ඔවුන්ගේ විශේෂ අවශ්‍යතාවයන්ට ගැළපෙන ආකාරයට අධ්‍යාපන අවස්ථා සංවර්ධනය නොවීම හේතුවෙන් ආබාධිත ප්‍රජාව අධ්‍යාපන කටයුතුවලින් සම්පූර්ණයෙන් බැහැරවීම දක්නට ලැබේ. ඔවුන්ගේ අධ්‍යාපන අවස්ථා තහවුරුකිරීම සඳහා විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

- මෙම වසංගත තත්ත්වය එහි ආර්ථික සමාජයීය බලපෑම, රෝග නිවාරණය සහ අනුගමනය කළ යුතු සෞඛ්‍ය පිළිවෙත් පිළිබඳව අවිධිමත් සහ නොවිධිමත් අධ්‍යාපන මූලාශ්‍ර ඇසුරෙන් සිදු කරන ලද සහ සිදු වූ අධ්‍යාපනය දැනුම ලබාදීමේ ක්‍රියාවලිය අතිශයින් සාර්ථක ප්‍රතිඵල අත්කරදීමට සමත් වී තිබේ. අධ්‍යයනයට සම්බන්ධ වූ සියලු ම තරුණ තරුණියන් වසංගත තත්ත්වය පිළිබඳව ඉහතින් සඳහන් කළ සියලු ම කරුණු පිළිබඳව හොඳින් දැනුම්වත්ව සිටියහ. ශ්‍රී ලංකාවේ නොවිධිමත් අධ්‍යාපන ක්‍රම පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමු නොවන අතර මෙම අවිධිමත් සහ නොවිධිමත් අධ්‍යාපන ක්‍රමවේද සමාජ ප්‍රගමනය සංවර්ධනය

ඇති කිරීමෙහි කොතරම් දුරට කාර්යක්ෂම බලපෑමක් ඇතිකරලීමට සමත් වන්නේ ද යන්න මෙමගින් පැහැදිලිව පෙනී යයි. එබැවින් අවිධිමත් සහ නොවිධිමත් අධ්‍යාපනය ක්‍රමවේද පද්ධති ප්‍රවර්ධනය කිරීමට කටයුතු කිරීම ශ්‍රී ලංකාව අපේක්ෂා කරනු ලබන දැනුමින් පරිපූර්ණ සමාජයක් බිහිකිරිමෙහි ලා ඉතා වැදගත් කරුණක් වන අතර නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන්හි දී මේ පිළිබඳව අවධානය යොමු කළ යුතු වේ. මේ සඳහා සඳහා සිවිල් සංවිධානවල මැදිහත්වීම සාර්ථකව උපයෝගී කරගත හැකි වේ.

Coalition for Education Development (CED) is a consortium of organizations involved in the education sector at national provincial and local levels in Sri Lanka. Since its inception in 2004, CED has been involved in promoting civil society participation in formulating and implementing policies related to education in Sri Lanka. It is committed to steer the civil society participation as a vital part in the achievement of goals and targets of EFA, MDG and SDG declarations. Since SDG 4 goals provide the guideline for a new vision for education by 2030, CED has already addressed the issues of promoting civil society involvement in education development tasks of Sri Lanka. CED is a member organization of ASPBAE.

**Coalition for Educational Development (CED Sri Lanka)**
**51/1, Silva Lane, Rajagiriya, Sri Lanka**
**Phone: +94 112 887642**
**Website: www.cedsrilanka.org**